# සටහන

2016 ජනවාරි - පෙබරවාරි 1 - 2 කලාපය




# රුපියලේ 1 ගමන්මග

ISSN 1391-3697

9 780041 001037

රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව




## ටොලමිගේ ලෝක සිතියමේ ශ්‍රී ලංකාව
# ලොකු ඇයි?




ක්‍රි.ව. 150 තරම් ඈතක, රෝමානු ගණිතඥයකු වූ ටොලමි, තමන් සකස් කළ ලෝක සිතියමේ ලංකාවේ පිහිටීම හරියට ලකුණු කරලා තිබුණා. එහෙත් ඔහු "තැප්‍රොබානා" ලෙස නම් කළ ලංකා ද්වීපය ප්‍රමාණයට වඩා ලොකුවටයි ඇඳලා තියෙන්නේ.

මුහුදු සේද මාවතේ හරි මැද පිහිටි මේ දිවයින, ටොලමි ගේ පරිකල්පනයට ලොකුවට පෙනුනේ අහම්බෙන් ද? නැති නම් නැගෙනහිරින්, බටහිරින් පැමිණි වෙළෙන්ඳන්, දේශ ගවේශකයන් එකට මුණගැසුනු, ජාත්‍යන්තර ආර්ථිකයක කේන්ද්‍රස්ථානය වූ ලංකාවේ ආර්ථික කටයුතුවල කීර්ති ප්‍රභාව, මේ කුඩා දිවයින විශාලනය කර දැක් වූ නිසා ද?

හාරා අවුස්සා, සොයාගෙන, දැනගෙන, අනාගතය සඳහා තැන්පත් කළ යුතු ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ දැනුම එක ම වහලක් යටට ගොනු කරන ජාතික ව්‍යාපෘතිය.

**ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය**
**The Economic History Museum of Sri Lanka**

පුරාණයෙන් රැපියලට

**ව්‍යවහාර මුදල් දැක්ම**
**කොළඹ කොටුව, චැතම් වීදියේ**
**සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ**
**මහජන ප්‍රදර්ශනය සඳහා විවෘතයි.**

සඳුදා සිට සෙනසුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා විවෘතයි.
කණ්ඩායමක් වශයෙන් පැමිණෙන්නේ නම් දිනයක් සහ වේලාවක් කලින් වෙන් කරවාගෙන පැමිණෙන්න
දුරකතන : 2444502, 2477421, 2477132, 2477257
ෆැක්ස්: 112346304





"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

| | | |
|---|---|---|
| පිටපතක මිල | : | රු. 20.00 |
| වාර්ෂික දායකත්වය | : | රු. 480.00 |
| (තැපැල් ගාස්තු ද ඇතුළත්ව) | | |

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

35 වෙළුම 1-2 කලාපය 2016 ජන. - පෙබ. ISSN 1391-3697

1

# ශ්‍රී ලංකා රුපියලේ ගමන් මග

විනීතා හේරත්, මාතලේ ප්‍රාදේශීය කාර්යාලය

## හැඳින්වීම

එක් එක් රටවල මුදල් ඒකක හැඳින්වෙන්නේ විවිධ නම්වලින්. එහෙත් පොදුවේ ගත් කළ මුදල්වල උත්පත්තිය ලොව සෑම දෙසක ම සිදුවූයේ බොහෝ දුරට එක සමාන අයුරින්. වර්තමාන මුදලෙහි ස්වරූපය ඉතා දීර්ඝ කාලීන විපර්යාසයක ප්‍රතිඵලයක්. අවුරුදු දහස් ගණනක් තිස්සේ විවිධ ආකාරයේ මුදල්, මිනිසා ගේ ගනුදෙනු කටයුතු පහසු කිරීමට උපකාරී වුණා. මුදල් ව්‍යවහාරයට පිවිසීමත් එහි ව්‍යාප්තියත් සමඟ ඇතිවූ සංකීර්ණතා ලිහිල්කර ගැනීමේ මාර්ගයක් ලෙසයි බැංකු ක්‍රමය ලොවට පිවිසියේ. ඒ අනුව බැංකු ක්‍රමය මුදල් ගනුදෙනු විසින් උත්පාදනය කරන ලද අතර, මහ බැංකු ක්‍රමය මුදල් සහ බැංකු ක්‍රමයෙහි ම විකාසනයක් ලෙස බිහිවූවක්.



නිෂ්පාදනයේ දී අතිරික්තයක් ජනිතවීමත්, තම අවශ්‍යතා සියල්ල තනි ව සපුරා ගැනීමට නොහැකිවීමත් නිසා එම අතිරික්ත නිෂ්පාදනය තමාට සපුරා ගැනීමට අවශ්‍ය වූ වෙනත් අවශ්‍යතාවක් එනම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ ලබාගැනීම වෙනුවෙන් හුවමාරු කිරීමට අතීතයේ විසුවෝ හුරුපුරුදු වුණා. බාට(ර්) ක්‍රමය ලෙස හඳුන්වන්නේ මෙසේ භාණ්ඩවලට/සේවාවලට භාණ්ඩ හෝ සේවා හෝ හුවමාරුකර ගැනීම යි. බොහෝ විට මේ සඳහා යොදා ගත්තේ සතුන්. පසුව කෘෂි නිෂ්පාදනයෙහි අතිරික්තයක් ජනිතවීමත් සමඟ හුවමාරුව සඳහා බෝග යොදා ගත්තා. එහෙත් මෙම ක්‍රමයෙහි නොයෙකුත් අඩුපාඩු, සීමා තිබුණා. කෙනෙකුට තමාට අවශ්‍ය භාණ්ඩ ලබාගැනීමට එම භාණ්ඩ තිබෙන අයෙකු හමුවීම ම පමණක් සෑහුනේ නැහැ. ගනුදෙනුවට සම්බන්ධවෙන අනෙක් පාර්ශ්වයටත් අනෙක් පුද්ගලයා ළඟ ඇති භාණ්ඩ ලබා ගැනීමට අවශ්‍යතාවක් ද තිබිය යුතු වුණා.

ගනුදෙනුවල දී මෙසේ අවශ්‍යතා අතර නොගැලපීම් තිබීම මෙම ක්‍රමයේ පැවති ප්‍රධාන දුර්වලතාවක්.

හුවමාරුව සඳහා යොදා ගැනුනු ද්‍රව්‍යවල හුවමාරු වටිනාකම් ද සංකීර්ණ වුණා. වටිනාකම මිණීම ද අපහසු වුණා. මේ නිසා භාණ්ඩ හුවමාරුවේ දී නොයෙකුත් ගැටලු පැන නැගුණා.

බාටර් ක්‍රමයේ මේ විදිහට ප්‍රශ්න මතුවෙන්න ගත්තා ම ගනුදෙනු සඳහා විකල්ප ක්‍රමයක් සොයා ගන්න මිනිසුන්ට සිදු වුණා. ඒ සොයා ගත්ත ක්‍රමයේ දී ත් කළේ භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කරන එක ම යි. ඒත් ඒ කලින් විදිහට නෙවෙයි. එහි දී එක් භාණ්ඩ වර්ගයක් වටිනාකම මනින ඒකකයක්, හුවමාරු මාධ්‍යයක් විදියට, එහෙමත් නැත්නම් මුදලක් ලෙස ක්‍රියා කළා. ඒවා හැඳින්වුණේ භාණ්ඩ මුදල් ලෙස යි.

මේ ක්‍රමයේ දී යම් භාණ්ඩයක් හුවමාරු මාධ්‍ය ලෙස යොදාගනිමින් ගනුදෙනු කිරීමට නම් සමාජයේ ඒ සඳහා පොදු පිළිගැනීමක් තිබිය යුතු වුණා.

### කල්පිත උදාහරණයක්:



එක් ජන කොටසක් හුවමාරු මාධ්‍ය වශයෙන් භාවිතා කළේ දුම්කොළ. මෙම ජන කොටසෙහි එක් අයෙක් වළං නිෂ්පාදනයේ යෙදුනා. තවත් අයෙක් කුකුළන් ඇතිකළා. වළං

නිෂ්පාදනය කළ පුද්ගලයාට කුකුළෙකු ලබා ගැනීමට අවශ්‍ය වුණා. එහෙත් කුකුළන් ඇතිකරන පුද්ගලයාට ඒ අවස්ථාවේ වළංවල අවශ්‍යතාවක් තිබුණේ නැහැ. එහෙත් මෙහි දී වළං හිමි පුද්ගලයාට තම වළංවලින් කිහිපයක් දී ඒවාට හිලව්වට දුම්කොළ හිමි පුද්ගලයාගෙන් දුම්කොළ ලබාගත හැකි වුණා. ඊට පසු එම දුම්කොළ ලබා දී කුකුළන් හිමි පුද්ගලයාගෙන් ඔහුට කුකුළෙකු ලබාගත හැකි වුණා. ඊට හේතුව එම ජන කොටස අතර හුවමාරු මාධ්‍ය ලෙස දුම්කොළ භාවිතයට එකඟතාවක් තිබීම යි. පිළිගැනීමක් තිබීම යි. මෙහි දී කුකුළන් හිමි පුද්ගලයාට එම අවස්ථාවේ දුම්කොළවල අවශ්‍යතාවක් නොතිබුණා වුවත් ඒවා පසු අවස්ථාවක තමාට අවශ්‍ය දෙයක් ලබාගැනීමේ දී හුවමාරු මාධ්‍ය ලෙස භාවිතා කිරීම සඳහා තබාගත හැකි වුණා. ඒ අනුව ගවයන්, ඌරන්, කුකුළන් වැනි සත්තුත්, දුම්කොළ, ලුණු, හාල්, පොල් වැනි පරිභෝජන භාණ්ඩත් සිප්පිකටු, බෙලිකටු, විවිධ ගල් වර්ග, ඇට වර්ග ආදියත් ඒ විදිහට මුදල් ලෙස භාවිතයට ගැනුනා. ඒ අනුව භාණ්ඩ මුදල්

- පොදු පිළිගැනීමක් තිබීම
- හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිතයට ගතහැකිවීම සහ
- වටිනාකමේ සන්නිධියක් වශයෙන් පැවතීම යන කරුණුවලින් සමන්විත වුණා.

මේ ක්‍රමයේ සෘජු භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති තරම් ම දුර්වලතා නො තිබුණත් කාලයක් යනකොට ඒ ක්‍රමයත් ඒ තරම් ම සාර්ථක වන බවක් පෙනුනේ නැහැ. ඇතැම් භාණ්ඩ මුදල් ලෙස භාවිතා කිරීම ඉතාම පහසු වුවත් තවත් සමහරක් දෑ භාවිතා කිරීම ඉතාමත් ම අපහසු වුණා. ගවයන් හෝ ඌරන් හෝ වැනි සතුන් භාණ්ඩ මුදල් ලෙස සැලකූ සමාජවල ඉතා කුඩා වටිනාකම් සඳහා ගෙවීම් කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වුණා. මුදල් ලෙස සැලකූ සමහරක් දේ කාලයක් තියාගන්න බැරි වුණා. තවත් සමහරක් දේ ඉතාමත් ම සුලභ වුණා. තමන්ගේ වටපිටාවෙන් ලේසියෙන් ම හොයා ගන්න පුළුවන් දෙයක් ලබා ගන්න තමන්ට තියෙන වටින දෙයක් දෙන්න කවුද සතුටු වෙන්නෙ? භාණ්ඩ මුදල් පිළිගැනීම ඒ විදිහට ප්‍රතික්ෂේප කළා ම ගනුදෙනු සඳහා වෙනත් ක්‍රමයකට යන්න මිනිසුන්ට සිදු වුණා.

ඒ අනුව, රත්තරන්, රිදී වගේ වටිනා කියන දුර්ලභ දෙයක් මුදල් ලෙස පිළිගන්න එක හොඳයි කියල සමාජයේ පිළිගැනීමක් ඇති වුණා. ඒ වගේ දෙයක් ඕන කෙනෙකුට ලේසියෙන් හොයා ගන්නත් බෑ. නිෂ්පාදනය කරන්නත් බෑ. ඒ නිසා රත්තරන් සහ රිදී ගනුදෙනු කරන්න හොඳ මාර්ගයක් වුණා. අද අපි කාසි විදිහට භාවිත කරන මුදල්වල උත්පත්තියට පසුබිම හැදුනේ එහෙම යි.

ඒත් මේ හැම දෙයක් ම සිදුවුණේ දවසකින් දෙකකින් නෙවේ. සියවස් ගණනාවක් තිස්සේ.

රත්තරන් හා රිදී ගනුදෙනු සඳහා භාවිතයට ගැනීමේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 2000 තරම් ඈත කාලය දක්වා දිව යනවා. එය ආරම්භ වුණා යැයි සැලකෙන්නේ බැබිලෝනියාවෙන්. වෙනත් ද්‍රව්‍ය මුදල් ලෙස භාවිත කළාට වඩා වාසි රැසක් ලෝහ මුදල් භාවිතයෙන් ලබා ගත හැකි වුණා. ලෝහ, මුදල් ලෙස භාවිත කිරීමේ දී;

- ඉහළ වටිනාකම් සහිත ගනුදෙනුවල දී ගෙවීම් කිරීම ඉතාමත් ම පහසු වුණා.
- ඒවා මීට පෙර මුදල් ලෙස භාවිත කළ විවිධ ගල් වර්ග, හා සිප්පිකටු වැනි ද්‍රව්‍ය තරම් සුලභ වුණේ නැහැ.
- දීර්ඝ කාලීන ව භාවිත කිරීමට ඇති හැකියාව ද ලෝහ මුදල්වල දැකිය හැකි වූ වාසිදායක ලක්ෂණයක්.



ලිඩියාවේ කාසියක්

කොහොම වුණත් මුල දී රන් හා රිදී ගනුදෙනු සඳහා යොදාගෙන තිබෙන්නේ අද අපි දකින ආකාරයේ කාසි ස්වරූපයෙන් නොවේ. ඒවා කාසි බවට පෙරළුනේ ක්‍රිස්තු පූර්ව හයසිය ගණන්වල කියලයි විශ්වාස කරන්නේ. එය කළේ බටහිර ආසියාවේ ඇනටෝලියානු අර්ධද්වීපයේ තිබෙන ලිඩියාවේ වැසියෝ. ඔවුන් කනක රජත කියන රන් හා රිදීවලින් සෑදුණු ස්වභාවික ලෝහයක් මුදල් ලෙස හැඩගස්වලා භාවිතයට ගන්න පටන් ගත්තා. ලෝකයේ කාසි ටංකනයේ පළමු වැනි අදියර තමයි ඒ. ඒ කාසියට නියමිත බරක් තිබුනා. රාජ්‍ය මුද්‍රාව තිබුණා. මේ කාසි ක්‍රිස්තු පූර්ව 550 පමණ වෙද් දී ලෝකයේ සතර දිග් බාගයේ සියලු ම නගරවල භාවිත කරන්න පටන් ගත්තා. ඒ රන් හා රිදී කාසි ලෙසින්.

## ශ්‍රී ලංකාවේ කාසි ඉතිහාසය ලුහුඬින්

රන් හා රිදී කාසි භාවිතය සම්බන්ධයෙන් අපේ රටටත් තිබෙන්නේ දිගු ඉතිහාසයක්. ක්‍රිස්තු පූර්ව 543 සිදු වූ විජයාගමනයටත් පෙර සිට ම ලංකාවේ වෙළෙඳ ආර්ථිකයක් තිබුණු බවට ජාතක කතා හා පාළි අටුවා වැනි නොයෙකුත් මූලාශ්‍රවල සඳහන් වෙතත් එකල භාවිත කළ මුදල් වර්ග මොනවාද යන්න පිළිබඳ නිශ්චිතව ම සඳහන්ව නැහැ. විජය හා පණ්ඩුකාභය වැනි පැරණි ම රජවරුන්ගේ කාලවලත් මුදල් භාවිත කළ බවට නොයෙකුත් කතා පුවත්, පාළි අටුවා හා වෙනත් නොයෙකුත් මූලාශ්‍රවල සඳහන් වෙනවා. ඒත් ඓතිහාසික ලංකාවේ කාසි භාවිතය පිළිබඳ නිශ්චිතව ම සඳහන් වෙන පළමු වැනි සෙල් ලිපිය ක්‍රිස්තු පූර්ව 3 වැනි සිය වසට අයත් වන්නක්. මේ අවධිය අයත් වන්නේ අනුරාධපුර යුගයට.

අනුරාධපුර යුගය ලංකා ආර්ථික ඉතිහාසයේ සුවිශේෂත ම අවධියක්. එය ඇරඹුනේ ක්‍රි.පූ. 437 දී පණ්ඩුකාභය කුමරු රජවීමත් සමඟ. ඔහුගේ පාලන කාලය තුළ නගර නිර්මාණ ශිල්පයේ හා වාපි කර්මාන්තයේ සුවිසල් දියුණුවක් ඇති වුණා. එ පමණක් නෙවෙයි, එ කල රට වටා ගංගා මෝය ආශ්‍රිත ව වරාය සහ තොටුපොළ රැසක් ක්‍රියාත්මකව තිබුණා. ඒවා ජාත්‍යන්තර වෙළෙඳාම ඔස්සේ ලංකා ආර්ථිකය තුළ සුවිශේෂ කාර්යභාරයක් ඉටුකර තිබෙනවා.

ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් ලංකාව අතීතයේ දිනා තිබුණු කීර්ති නාමය දෙස් විදෙස් නොයෙකුත් වාර්තාවලින් තහවුරු වෙනවා. ඒවාට අනුව එකල මේ දිවයින මහා වෙළෙඳ මධ්‍යස්ථානයක්. ගොඩබිම් සේද මාර්ගය ඔස්සේ ගැල් මගින් ඉන්දීය වරාය වෙත ගෙන ආ භාණ්ඩ නැව් මාර්ගයෙන් මහාතිත්ථයටත්, ගෝකණ්ණතිත්ථයටත් ගෙනැවිත් එතැන් සිට ගැල්වල පටවා අනුරාධපුර නගරයට ගෙන ගිය අතර, ලංකාව මුහුදු සේද මාර්ගයේ මධ්‍යයේ පිහිටීම ද විදෙස් වෙළෙඳ නැව් මෙරටට පැමිණීමට හේතු වී තිබෙනවා. විදේශිකයින්ගේ වාර්තාවලින් සහ පුරා විද්‍යාත්මක සාක්ෂිවලින් පැහැදිලි වෙන්නේ එ වකට අනුරාධපුරය ඉතා ඉසුරුමත් විසල් නගරයක් ව පැවති බවයි. එය දේශීය වශයෙන් භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙසත් අපනයනය සඳහා භාණ්ඩ සැකසූ ස්ථානයක් ලෙසත් කටයුතුකර තිබෙනවා. ඒ අනුව අද අප ප්‍රති අපනයන කටයුතු ලෙස හඳුන්වන ක්‍රියාවලිය මෙයට ශතවර්ෂාධික කාලයකටත් පෙර අප රටේ ක්‍රියාත්මක වී ඇති බවයි පැහැදිලි වෙන්නේ. ඒ අනුව එදත් අපේ ලක් බිම නාවුක මධ්‍යස්ථානයක් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළක් ලෙස ක්‍රියාත්මක වී තිබෙනවා.

ශ්‍රී ලංකාවේ කාසි භාවිතය පිළිබඳ සඳහන් පැරණිතම සෙල්ලිපිය වන කෑගල්ල මාම්පිට විහාර සෙල්ලිපියට අනුව එකල ලංකාවේ භාවිත කර ඇත්තේ කහාපණ නම් මුදල් වර්ගය යි. මෙම කාසි වර්ගය කහවණ, පුරාණය, ධරණය ආදී නම්වලින් ද හඳුන්වා තිබෙනවා. කහවණු යනුවෙන් අපේ පැරණි ලේඛනවල ද සඳහන් වෙන්නේ මෙම මුදල් පිළිබඳවම යැයි විශ්වාස කළ හැකි යි. ඒ හැරුණු විට ලක්ෂ්මී කාසි, ඇතා සහ ස්වස්තික කාසි, සිංහ කාසි, රන් කහවණු ආදී දේශීය කාසි සහ ඉන්දීය, රෝම, අරාබි සහ චීන ආදී විදේශ කාසි ද භාවිත කර තිබෙනවා.


අනතුරුව එළැඹි පොළොන්නරු යුගයේ දී වරින් වර ඉන්දීය ආක්‍රමණවලට, විශේෂයෙන් ම දකුණු ඉන්දීය ආක්‍රමණවලට මුහුණ පෑමට අප රටට සිදුවී තිබෙනවා. ඒ අනුව චේර, චෝල, පාණ්ඩ්‍ය, පල්ලව ආදී ආක්‍රමණිකයන්ගේ කොන්ගුචේර, පල්ලව, සේතු ආදී කාසි මෙරට භාවිත කර ඇති බැව් දැකිය හැකියි. එමෙන් ම මෙම අවධියේ චීන සහ අරාබි කාසි ද භාවිතා කර තිබෙනවා. අනුරාධපුර රාජධානි සමයේ අවසන් අවධියේ නිෂ්පාදනයක් ලෙස සැලකෙන රන් කහවණුව පොළොන්නරු අවධියට පිවිසුනේ තඹ කාසියක් බවට පෙරළෙමින්. කොහොම වුනත්, පොළොන්නරු යුගය ආරම්භයේ සිට දඹදෙණි යුගය දක්වා භාවිත කරන ලද කාසි මධ්‍යකාලීන කාසි (දඹදෙණි) ලෙස හඳුන්වනු ලබනවා. දඹදෙණි මස්ස ලෙස හඳුන්වා ඇත්තේ පොළොන්නරු රාජධානි සමයේ නිකුත්කරන ලද මස්ස කාසියමයි. සිංහල මස්ස ලෙසින් හඳුන්වන්නෙත් එම කාසියම යි. මෙම කාසි කෝට්ටේ යුගය දක්වාම භාවිතයට ගෙන තිබෙනවා. විදේශ ආක්‍රමණවල බලපෑමෙන් කෝට්ටේ සහ මහනුවර රාජධානිවල රන් පනම, රිදී පනම, වරාගන්, ලාරින් (අඟුටු මස්ස, කොකු මස්ස) ආදී කාසි වර්ග භාවිතයට පැමිණ ඇති බැව් දැකිය හැකියි. එමෙන් ම



පෘතුගීසි මලක්කා, ලන්දේසි දොයිතු සහ තුට්ටු, ඉංග්‍රීසි පවුම්, සිලිං, පැන්ස ද අප රට භාවිතයට පැමිණියේ බටහිර ජාතීන්ගේ ආක්‍රමණ සමඟ යි.

## ලොව මුදල් භාවිතයේ පෙරළියක්...

8 වැනි සිය වස ආරම්භ වන විට චීනයේ වෙළෙඳාම ඉතාමත් ම දියුණුවට පත්ව තිබුණා. එයට සමගාමීව එයට ප්‍රමාණවත් පහසුකම් සැලසීමට මුදල් ක්‍රමයත් දියුණුවන්නට වුණා. ආර්ථික කටයුතුවල ව්‍යාප්තියත් සමඟ මුදල් එහා මෙහා ගෙන යෑමේ, සංසරණයවීමේ වාර ගණන ද ඉහළ ගියා. එහිදී කාසි එහා මෙහා ගෙන යෑම ගැටලුවක් වුණා. එහි ප්‍රතිඵලය වූයේ කාසිවලට ආදේශකයක් ලෙස මුදල් නෝට්ටුවල බිහිවීම යි. මුදල් නෝට්ටුවල උත්පත්තිය සිදුවූයේ චීනයේ. එකල චීනයේ එක් එක් ප්‍රදේශවල බදු එකතු කිරීම සඳහා නියෝජිතයන් පත්කර සිටියා. වෙළෙන්දන්ගේ මුදල් කටයුතු පහසු කිරීමට මොවුන් මැදිහත් වුණා. ඒ අනුව වෙළෙඳාම සඳහා දුර බැහැර ප්‍රදේශවලට ගොස් සිටි වෙළෙන්දන් තමන් ඉපයූ ලාභය මෙම ආයතනවලට භාර දුන් අතර, ඒ මුදල තම ප්‍රදේශයේ පරිපාලන නියෝජිතයන්ගෙන් ලබා ගැනීමට හැකි වුණා. නියෝජිත ආයතනවලට මුදල් බාර දුන් විට එකී නියෝජිත ආයතන විසින් ඒ මුදල් වෙනුවෙන් වෙළෙන්දන්ට කුවිතාන්සියක්



ලොව පැරණි ම මුදල් නෝට්ටුවක්

ලබාදුන්නා. ඒ කුවිතාන්සි චීන භාෂාවෙන් හැඳින්වුණේ ෆෙයි-ෂියාන් නමින්. එහි තේරුම පියාඹන මුදල් යන්නයි.

මුදල් ක්‍රමයේ ඇතිවූ මෙම වෙනස සිදුවූයේ චීනයේ පමණක් නොවේ. 14 වැනි සියවස අග භාගය පමණ වන විට ලොව පුරා වෙළෙඳ කටයුතු වඩ වඩාත් ප්‍රසාරණය වන්නට වුණා. ඒත් සමඟම රන් හා රිදී මුදල් ව්‍යාපාර කටයුතු උදෙසා තැනින් තැන ගෙන යෑම දුෂ්කර කටයුත්තක් වුණ නිසා ඒ දුෂ්කරතා මඟහරවා ගැනීමට අතරමැදි පිරිසකගේ මැදිහත්වීමක් අවශ්‍ය වුණා. ගනුදෙනුවලට මැදිහත් වූ මෙම අතරමැදි පිරිස හැඳින්වුනේ රන්කරුවන් හෝ මුදල් මාරුකරන්නන් ලෙස යි. බොහෝ වෙළෙන්දන්ට තම රන් හා රිදී මුදල් මෙම අතරමැදියන් ළඟ තබා යෑම ඉතාමත් පහසු, සුරක්ෂිත සහ විශ්වාසදායක ක්‍රමයක් වුණා. මෙහිදී රන්කරු මුදල් වෙනුවෙන් කඩදාසි ලියවිල්ලක් කාඩ්පතක් සේ නිකුත් කළා. තැන්පත්කරුට මෙම මුදල් වියදම් කළ හැකි අයුරු (වටිනාකම්) එහි සඳහන්ව තිබුණා. මෙම සහතිකය සඳහා රිදී හෝ රන්වලින් නැවත ආපසු ගෙවීම සහතික කොට තිබුණු බැවින් මෙම සහතික පත් සඳහා තිබුණේ ඉහළ පිළිගැනීමක්. ක්‍රි.ව. 1500 ගණන්වල ඇම්ස්ටර්ඩෑම්වල මෙම ක්‍රමය ඉතා හොඳින් ක්‍රියාත්මක ව තිබෙනවා. මෙහිදී තැන්පත්කරුට රන්කරුගෙන් තමා තැන්පත් කළ මුදල් ආපසු ලබා ගැනීමට හැකිවූවා පමණක් නොව රන්කරුවා වෙත ලියවිල්ලක් මඟින් දැනුම්දීමකින් ගිණුමින් යම් වෙනත් අයෙකුට නිශ්චිත රන් හෝ රිදී හෝ ප්‍රමාණයක් ලබාදීමට ද හැකියාව ලැබුණා. මෙය අද අප ගිණුමකින් තවත් ගිණුමකට මුදල් හර හා බැර කිරීම හා සමානයි. ක්‍රි.ව. 1500 ගණන්වල මෙම ක්‍රමය ඉතාලියේ ද ඉතා හොඳින් ක්‍රියාත්මක වී තිබෙනවා. ඉතාලියේ මුදල් හුවමාරුකරුවන් බංකුවක් මත වාඩි වී මෙම ගනුදෙනු සිදු කළ අතර ඉතාලි භාෂාවෙන් බංකුව හැඳින්වූයේ බැංකෝ (banco) යනුවෙන්. ඒ මඟින් මෙම මුදල් හුවමාරු කරන ස්ථානයට බෑන්ක් (Bank) යනුවෙන් අලුත් නමක් ද පටබැඳුනු බවයි විශ්වාස කෙරෙන්නේ.

කෙසේ වෙතත් මෙම කඩදාසි සහතික පත් නිකුතුව රන් හා රිදී මත පදනම්ව පැවති හෙයින් වාණිජ්‍යයේ වර්ධනයට ඉවහල් වන පරිදි ප්‍රමාණවත් මුදල් සැපයීමක් හෝ ණය සැපයීමක් හෝ සිදුවුණේ නැහැ. මෙම ක්‍රමය යටතේ කෙරුණේ තැන්පතු භාර ගැනීමක් පමණයි. ණය දීමක් සිදුවූයේ නැහැ. එහෙත් පසු කලෙක තැන්පත්කරුවන් තමන් තැන්පත් කරන මුදල්වලින් නිතර ඉල්ලා සිටින්නේ ඉතා කුඩා කොටසක් බව රන්කරුවන්ට හැඟීගියා. මේ නිසා තැන්පත් තුළින් ණය දීමට ඇති හැකියාව පිළිබඳ ඔවුන්ගේ අවධානය යොමුවුණා. මෙසේ මුදල් මාරුකරන්නන් හා රන්කරුවන් ණය සැපයීම සම්බන්ධව ගත් වැදගත් පියවරෙහි ප්‍රතිඵලය වූයේ බැංකු ක්‍රමයකට පදනම වැටීම. ඔවුහු තැන්පත්කරුවන් තැන්පත් කළ රන් හෝ රිදී හෝ වලින් යම් නිශ්චිත ප්‍රමාණයක් ඉල්ලූ විටෙක නැවත ආපසු ඔවුන් වෙත නිකුත්කිරීම සඳහා සංචිතයක් ලෙස තබාගනිමින් ඉතිරි කොටස ණය දීම සඳහා යොදාගත්තා. මේ මඟින් ඔවුන් පොලී ලෙස ආදායමක් ඉපයීමට සමත් වූ අතර සංසරණයේ පැවති මුදල් ප්‍රමාණය ද ඉහළ දැමුවා.

කෙසේවෙතත් එම ක්‍රමය භාවිතයේ දී සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු ඉස්මතු වන්නට වුණා. බොහොමයක් වෙළෙන්දෝ රන් හා රිදී පමණක් මුදල් ලෙස පිළිගත්තා. ණයදීම ආරම්භ කරනවාත් සමගම කටකතාවක් වැනි දෙයක් නිසා සියලු තැන්පත්කරුවෝ තම මුදල් ඉල්ලා බැංකුවට පැමිණිය හොත් තැන්පතු ලෙස ලබාගත් මුදල්වලින් කොටසක් ණය දීම සඳහා යොදාගෙන තිබූ බැවින් සියලුම තැන්පතුකරුවන්ගේ මුදල් සියල්ල එකවර ආපසු ගෙවීමට බැංකුවට ඉඩක් ලැබෙන්නේ නැහැ. එවන් අවස්ථාවක බරපතල ලෙස ද්‍රවශීලතා ගැටලුවකට මුහුණපෑමටයි බැංකුවට සිදුවෙන්නේ. එහි දී පළමු ආ ගනුදෙනුකරුවන්ට මුදල් ද පසුව ආ අයට ලිඛිත සාක්ෂියක් පමණක් ද ඉතිරිවීමට ඉඩතිබුණා.

එමෙන් ම යම් හෙයකින් බැංකුව දුන් ණය මුදල් කලට වේලාවට ආපසු අයකරගැනීමට නොහැකි වුවහොත් එහිදී ද බැංකුවට මුහුණ පෑමට සිදුවන්නේ ගැටලු සහගත තත්ත්වයකට. මෙවන් තත්ත්වයක් දැනගත් වහාම තැන්පත්කරුවන් බැංකුවෙන් තම මුදල් ආපසු ලබාගැනීමට පෙළඹෙනවා.

මෙවැනි ක්‍රමයක ඇති අනෙක් ගැටලුව ආර්ථිකයකට අවශ්‍ය ප්‍රමාණයට වඩා ණය මැවීමක් සිදුකළ හොත් ඇතිවිය හැකි තත්ත්වය යි. මුදල් ණයට ගන්නා අය ඒවා නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් ආර්ථිකයේ නිෂ්පාදන ශක්තිය ද වර්ධනය වෙයි. එහෙත් මුදල් ණයට ගන්නා අය ඒවා නිෂ්පාදන කාර්යයේ නොයොදා වෙනත් කටයුතුවලට යෙදුව හොත්, සැබෑ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයක් නොවී ආර්ථිකයේ මුදල් සංසරණයක් පමණක් සිදුවෙයි.

මෙසේ තැන්පතු පදනම් කරගනිමින් චෙක්පත් නිකුත් කිරීම හා සමාන ක්‍රමයක් අනුගමනය කරමින් ව්‍යාප්ත වුණු බැංකු කටයුතු වාණිජ්‍යයේ ව්‍යාප්තියත් සමඟ ම ක්‍රම ක්‍රමයෙන් ඊට අනුකූලවන පරිදි ප්‍රසාරණය වන්නට වුණා. ඒ හා ම මෙසේ ව්‍යාපාරික කටයුතුවල නියැලෙන බැංකු එනම් මුදල් වෙළෙඳපොළ මනාව පාලනය කිරීම සඳහාත් මෙම ක්‍රමය මුහුණපාන අර්බුදකාරී තත්ත්වයන් පාලනය කිරීම සඳහාත් වඩාත් සුහදායී ක්‍රමයක් ආර්ථික ලෝකයට අවශ්‍ය වුණා. එම අවශ්‍යතාව සපුරාලීමට බිහිවූ ආයතනය අද අප මහ බැංකු නමින් හඳුන්වන ආයතනය යි. 1600 ගණන්වල පිහිටුවන ලද ස්වීඩනයේ රික්ස් බැංකුව සහ එංගලන්ත බැංකුව ලොව පැරණිතම මහ බැංකු ලෙසයි සැලකෙන්නේ. එහෙත් මෙම බැංකු මහ බැංකු යන සංකල්පය යටතේ පිහිටුවන ලද ඒවා නොවේ. මහ බැංකු පිළිබඳ ඉතිහාසය ද මුදල් වෙළෙඳපොළේ ක්‍රමික ව්‍යාප්තියත් සමඟ ම ඉතා දීර්ඝ කාලයක් මුලුල්ලේ විකාසනය වූවක්.

## වසර දහස් ගණනක් පැරණි අපේ බැංකු ක්‍රමය

කෙසේ වෙතත් අද දවසේ ක්‍රියාත්මක වන වෙළෙඳ සමාගම් හා බැංකුවලට සමාන වණික් ග්‍රාම හෙවත් වාණිජ ශ්‍රේණි ගණනාවක් ඉතා ඈත අතීතයේත් අපේ රටේ ක්‍රියාත්මක වුණා. ඒ පිළිබඳ තොරතුරු නොයෙකුත් සෙල්ලිපිවල සඳහන්.

### තෝනිගල සෙල් ලිපිය (ක්‍රි.ව.4 වැනි සියවස)

දේව නම් තැනැත්තෙක් කලහුමන නම් වාණිජ ශ්‍රේණියක් සමඟ ඇතිකරගත් ගිවිසුමක් පිළිබඳ මෙහි සඳහන්. වී දෙයාළ දස අමුණක් ද උඳු අමුණු සයක් ද, මුං ඇට (බයලි) දස අමුණක් ද වෙළෙඳ ශ්‍රේණිය බාරේ තැන්පත් කොට ඉන් ලැබෙන පොලිය වියදම් කළ යුතු ආකාරය මෙහි සඳහන්.

ඒ අනුව වියට සඳහා ගිවිසගත් සියයට 50 පොලිය ද අනෙකුත් ධාන්‍යවලට ලැබෙන සියයට 25 පොලිය ද යහිසපව්ව නම් ආරාමයක වර්ෂයක් පාසා පැවැත්වෙන අරියවංස උත්සවය සඳහා වියදම් කළ යුතු බව සඳහන්. මුල් භාගය වියදම් නොකොට, එසේම අඩු නොකොට පොලිය පමණක් වියදම් කළ යුතු බවයි මෙහි සඳහන් වෙන්නේ.

මෙම සෙල්ලිපිය බැංකු ක්‍රමය හා බදු අයකිරීම පිළිබඳ ලොව පැරණිම ලියවිල්ල ලෙසයි විශ්වාස කරන්නේ.

### ලබුඇටබැඳිගල සෙල්ලිපිය (ක්‍රි.ව. 5 වැනි සියවස)

උතුරු මැද පළාතේ පිහිටි මෙම සෙල් ලිපියේ සඳහන් වන පරිදි ඇමතිවරයෙකුගේ පුත් වූ සිරිනක නම් තැනැත්තෙක් මහතබක වෙළෙඳ ශ්‍රේණියෙහි කහවනු 100 ක් තැන්පත් කර තිබෙනවා. එම තැන්පතු මුදලට ලැබෙන පොලිය දේවගිරි නම් මහා ආරාමයක පැවැත්වෙන අරියවංස උත්සවය සඳහා යෙදිය යුතු බව එහි සඳහන්.

ලබුඇටබැඳිගලින් හමුවූ තවත් සෙල්ලිපියක මේ හා සමාන පුවතක් සඳහන්. එහි නටලපිටිය සිව නම් තැනැත්තෙක් දේවගිරි ආරාමයේ ප්‍රයෝජනය සඳහා කහවනු 20 ක් තැන්පත් කළ පුවතක් මෙහි සඳහන්. මෙම සෙල් ලිපියේ අග කොටස මැකී ඇතත් අරියවංස උත්සවය සඳහා එම මුදලේ පොලිය පමණක් ගත යුතු බව සඳහන් ව තිබුණු බවට යි විශ්වාස කෙරෙන්නේ.

### කළුදිය පොකුණ සෙල්ලිපිය (ක්‍රි.ව. 9 වැනි සියවස)

මෙම සෙල්ලිපියට අනුව තැන්පත්කරුගේ නම දළනා යි. ඔහු තැන්පත් කර ඇත්තේ රන් කළං 23 ක්.

දකුණු ගිරි වෙහෙරේ සංඝයාට දන් සැපයීම සඳහායි මෙය තැන්පත් කර ඇත්තේ.

අනුරාධපුරය ආශ්‍රිතව සොයාගෙන ඇති ක්‍රි.ව. 6 වැනි හා 7 වැනි ශත වර්ෂවලට අයත් කෙටි සෙල්ලිපි 8 ක මුදල් තැන්පත් කිරීම් පිළිබඳ ව සඳහන්. ඒ අනුව අභයගිරි විහාරයේ නඩත්තුව සඳහා පුද්ගලයන් හය දෙනෙක් කහවනු 100 බැගින් ද එක් අයෙක් කහවනු 1000 ක් ද තවත් අයෙක් කහවනු 2000 ක් ද තැන්පත් කොට තිබෙනවා.

## නෝට්ටු නිකුත් කළේ ආණ්ඩුව විතරක්ම ද?



ඓතිහාසික ශ්‍රී ලංකාවේ විවිධ යුගවල රජ දරුවන් විසින් මෙන් ම විවිධ වෙළෙඳ ශ්‍රේණි විසින් ද නිකුත් කළ මුදල් භාවිතයට ගෙන තිබෙනවා. බ්‍රිතාන්‍ය පාලන යුගයේ මුල් කාලයේ එනම් 1796 - 1844 මුදල් නිකුත් කරන ලද්දේ මහා භාණ්ඩාගාරය විසින්. එහෙත් 1845 - 1884 දක්වා ව්‍යවහාර මුදල් නිකුත් කිරීම පෞද්ගලික බැංකුවලට පවරා තිබෙනවා. 17 සහ 18 වැනි සියවස්වල රටවල් රැසක නිදහස් බැංකු ක්‍රමයක් ක්‍රියාත්මක වුණා. එම ක්‍රමය තුළ බොහෝ වාණිජ බැංකු තම තමන්ගේ ම මුදල් නෝට්ටු නිකුත් කළා. එහෙත් මේ ක්‍රමය තුළ පැවති දුර්වලතා නිසා බොහෝ රටවල බැංකු බිඳ වැටුණා. මුදල් නිකුත් කිරීමේ ඒකාධිකාරයක් සඳහා පාර කැපුවේ බැංකු ක්‍රමයේ පැවති මෙම අස්ථාවරත්වය යි. ඒ අනුව 1844 බැංකු පනතින් මුදල් නිකුත් කිරීමේ ඒකාධිකාරී බලයක් එංගලන්ත බැංකුවට හිමි වුණා. ඒත් ඔවුන් සිය යටත් විජිතවල මුදල් නිකුත් කිරීමේ එම ඒකාධිකාරී බලය ඒ ආකාරයෙන් ම ක්‍රියාවේ යෙදුවේ නැහැ. ඒ වෙනුවට යටත් විජිත සඳහා නිර්දේශිත වූයේ මුදල් නිකුත් කිරීමේ කතිපයාධිකාරී තත්ත්වයක්. ලංකාවේ ද මුදල් නිකුත් කිරීම සම්බන්ධයෙන් මෙම අවධියේ ක්‍රියාත්මක වූයේ එවන් තත්ත්වයක්.

ඒ අනුව තෝරා ගත් පෞද්ගලික බැංකු කිහිපයකට පමණක් මුදල් නිකුත් කිරීමේ බලය හිමිවුණා. එම බලය හිමි වුණේ 1844




බැංකු වරපත් ආඥා පනත යටතේ වරපත් ලත් බැංකුවලට යි. මුදල් නිකුත් කිරීමට වරපත් ලබාගැනීමටත් නිකුත් කරනු ලබන මුදල් නෝට්ටු වෙනුවෙනුත් ගාස්තුවක් ගෙවීමට එම බැංකුවලට සිදුවුණා. මේ විදිහට මුදල් නිකුත් කිරීම පෞද්ගලික බැංකුවලට පැවරීමෙන් ඒවායින් අයකරන ගාස්තු මඟින් එකල රජයට සැලකිය යුතු ආදායමක් උපයාගැනීමට හැකි වුණා. මුදල් නිකුත් කිරීම සම්බන්ධ සීමා නිර්ණය කරන ලද්දේ යටත් විජිත රෙගුලාසි මඟින්. ඒ අනුව මෙම බැංකු විසින් පවුම් නෝට්ටු සේ ම රුපියල් නෝට්ටු ද නිකුත් කළා.

ලංකාවේ රුපියල් ශත ක්‍රමය ඇරඹුනේ 1872 දී. ඒ අනුව සත 100 ක් රුපියලකට සමාන යැයි සැලකුණා. එකල ශත 1/4 , ශත 1/2, ශතය, ශත දෙක, ශත පහ, ශත දහය, ශත විසි පහ සහ ශත පනහ ලෙස රුපියලට වඩා අඩු වටිනාකම් සහිත කාසි රැසක් ගනුදෙනු සඳහා යොදාගත්තා. මේවා අතුරින් ශත 1/4, 1/2 සහ ශතය තඹවලින් ද අනෙකුත් කාසි පිත්තලවලින් ද නිෂ්පාදනය කර තිබූ බැව් දකින්න පුළුවන්.

ද ඕරියන්ටල් බෑන්ක් කෝපරේෂන්, ද චාර්ටඩ් මර්කන්ටයිල් බෑන්ක් ඔෆ් ඉන්දියා ලන්ඩන් ඇන්ඩ් චයිනා, මර්කන්ටයිල් බෑන්ක් ඔෆ් ඉන්දියා ලන්ඩන් ඇන්ඩ් චයිනා සහ ද ඒසියාටික් බෑන්කිං කෝපරේෂන් මෙසේ මුදල් නිකුත් කිරීමේ වරපත් ලත් බැංකුයි. ලංකාව තුළ මුලින් ම මුදල් නිකුත් කිරීමේ බලය හිමිවූයේ ඕරියන්ටල් බැංකුවට යි. එවකට සංසරණයේ පැවති මුදල්වලින් ¾ කටත් වඩා තිබුණේ මෙම බැංකුව විසින් නිකුත් කළ නෝට්ටු. වරපත් ලත් දෙවන බැංකුව වුනේ මර්කන්ටයිල් බැංකුව (මර්කන්ටයිල් බෑංක් ඔෆ් ඉන්දියා ලන්ඩන් ඇන්ඩ් චයිනා). 1884 මැයි මස බැංකු පරිපාලනයේ පැවති නොයෙකුත් දුර්වලතා සහ කෝපි වගාවෙන් ලද ආදායම පහළ වැටීමත් සමඟ ම ඕරියන්ටල් බැංකුව බිඳවැටුණා. මෙහි බිඳ වැටීමත් සමඟ ලංකා ආර්ථිකයේ මූල්‍ය අංශය බිඳවැටීමෙන් වළක්වාගැනීම සඳහා කඩිනමින් පියවර ගතයුතු වුණා. මෙහි ප්‍රතිඵලය වූයේ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයේ බිහිවීම යි.

## ලංකා ව්‍යවහාර මුදල් මණ්ඩලය බිහිවෙයි

ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය ස්ථාපිත කරන ලද්දේ 1884 අංක 32 දරන ව්‍යවහාර මුදල් ආඥා පනත යටතේ යි. මෙම ක්‍රමය යටතේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා පරිපාලනය ත්‍රිපුද්ගලයන්ගෙන් සමන්විත මුදල් කොමසාරිස් මණ්ඩලයකට පැවරුනා. මෙම කොමසාරිස් මණ්ඩලයේ සාමාජිකයන් වූයේ යටත් විජිත ලේකම්, භාණ්ඩාගාරික සහ විගණකාධිපතිවරයා යි.

ව්‍යවහාර මුදල් මණ්ඩලය යටතේ නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල්වලින් මෙන් ම එංගලන්ත පවුම්වලින් ද දක්වා තිබුණා.

මෙම ක්‍රමය යටතේ රුපියල, රුපියල් 2, රුපියල් 5, රුපියල් 10, රුපියල් 50, රුපියල් 100, රුපියල් 500, රුපියල් 1000 සහ





රුපියල් 10000 මුදල් නෝට්ටු නිකුත් කර තිබෙනවා. එහෙත් රුපියල් දස දහසේ මුදල් නෝට්ටු භාවිත කරන ලද්දේ බැංකු අතර සිදු කරන ලද ගනුදෙනු සඳහා පමණ යි.

නිකුත් කරන ලද නෝට්ටුවල නෛතික වලංගුභාවය සඳහා මුදල් කොමසාරිස්වරු දෙදෙනෙකුගේ අත්සන් ඒවා මත යොදා තිබුණා.

## නෝට්ටු කොළ පොත්

කටයුතු මෙසේ සිදුවෙමින් පවතිද් දී වරින් වර කාසි හා නෝට්ටු සම්බන්ධව විවිධාකාරයේ ප්‍රශ්න පැන නැඟුනා. කාසි හිඟය ඉන් එකක්. නෝට්ටුවල බිහිවීමට පාර කැපුවේ ද කාසි හිඟය යි. ඒ අනුව 1923 වසරේ රුපියලේ නෝට්ටු පොතක් ලෙස නිකුත් කෙරුනා. එය නෝට්ටු 25 කින් සමන්විත වුණා. ඒ හා සමානව ම 1927 රුපියල් 2 නෝට්ටු කොළ 25 කින් යුත් නෝට්ටු පොත් ද 1930 වසරේ රුපියල් 5 කොළ 20 කින් යුත් නෝට්ටු පොත් ද




නිකුත් කෙරුනා. ක්‍රම ක්‍රමයෙන් කාසි හිඟවීම උග්‍රවීමත් සමඟ පසු කාලීනව සත 50, 25, 10 සහ 5 ද නෝට්ටු ලෙස නිකුත් කර තිබෙනවා.

## කැලි කඩා ගෙවූ නෝට්ටු

අද අප ගනුදෙනු සඳහා  භාවිතයට ගන්නා නෝට්ටුවක් ගින්න, ජලය හෝ කෘමි සතුන්ගේ උවදුරක් වැනි වළක්වාගත නොහැකි හේතුවක් මත ඉරුනොත්, කොටසක් විනාශ වුනොත් ඒ සඳහා ඒවායේ වටිනාකම ගෙවීමේ බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතුයි. එහෙත් නෝට්ටුවක සම්පූර්ණ වටිනාකම ගෙවනු ලබන්නේ හානියටපත් නෝට්ටුවේ ¾ ක් වත් ඉතිරිවී තිබේ නම් සහ නෝට්ටුවේ වම්පස හා දකුණු පස ඇති අංක දෙකෙන් එක් අංකයක් හෝ සම්පූර්ණයෙන් කියැවීමට හැකි මට්ටමේ තිබේනම් පමණ යි. හානියට පත් නෝට්ටුවේ අඩක්, තනි කැබැල්ලක් ලෙස තිබේ නම් සහ එහි අංකය සම්පූර්ණව සහ පැහැදිලි ව තිබේ නම් ශ්‍රී ලංකා මහ බැංකුව ඒ සඳහා ගෙවනු ලබන්නේ වටිනාකමින් අඩක් පමණයි. කෙසේ වෙතත් නෝට්ටුවක් වුවමනාවෙන් ඉරාදැමීම නොකළ යුත්තක්. ඒත් ඒ අද යි.

එදා දවසේ තත්ත්වය නම් එසේ වූයේ නැහැ.




1939 සහ 1940 දී උද්ගත වූ කාසි හිඟයට පිළියම් ලෙස රුපියලට අඩු වටිනාකමක් ඇති නෝට්ටු නිකුත් කිරීමට හදිසි බලතල පිළිබඳ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර ව්‍යවහාර මුදල් මණ්ඩලයට බලය පැවරුනා. ඒ අනුව; ශත 05, ශත 10, ශත 25, ශත 50, රුපියල් 1 ලෙස ව්‍යවහාර මුදල් මණ්ඩලය නෝට්ටු නිකුත් කර තිබෙනවා. මේවා අතර නීත්‍යනුකූල ව ම ඉරාදැමිය හැකි නෝට්ටුවකුත් තිබුණා. ඒ සත 5 නෝට්ටුව. මේ නෝට්ටුවේ හරි මැදින් මුද්දරයක මෙන් සිදුරු පේළියක් තිබුණු අතර එහි එක කොටසක වටිනාකම සත 3 ක් ද අනෙක් කොටසේ වටිනාකම සත 2 ක් ද වුණා. ගනුදෙනුවේ අවශ්‍යතාව අනුව මේ නෝට්ටුව දෙකට ඉරා භාවිත කළ හැකි වුණා.

## බැංකු ක්‍රමය

1815 දී ලංකාව මුලුමනින් ම බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්වීමත් සමඟ ම වැවිලි කෘෂිකර්මය මෙහි මුල්බැස ගත්තා. ලංකා පොළොවෙහි සරුසාර බව වැවිලි කෘෂිකර්මයට ඉතාමත් ම යෝග්‍ය වූ බැවින් එතැන් සිට වැවිලිකරුවෝ විශාල සංඛ්‍යාවක් ලංකාවට සංක්‍රමණය වුණා. ලංකාවේ මහා පරිමාණ වැවිලි

කෘෂිකර්මයේ ආරම්භයේ දී එහි නිරත වූවෝ විදේශිකයන්. එවකට පැවති බැංකු ක්‍රමය මූලිකව ම කුරුඳු, කෝපි, තේ ආදී වැවිලි ආර්ථිකයේ උන්නතිය උදෙසා ප්‍රාග්ධන සම්පාදනය සඳහායි පැවතුනේ. බැංකු ක්‍රමය ද පූර්ණ වශයෙන් රඳා පැවතුනේ විදේශිකයන් අත.

ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද පළමු බැංකුව බෑන්ක් ඔෆ් සිලෝන්. එය ආරම්භ කරන ලද්දේ 1841 දී. එහෙත් මෙය වර්තමානයේ අප ලංකා බැංකුව ලෙස හඳුන්වන බැංකුව නොවේ. එය පිහිටුවූයේ බ්‍රිතාන්‍ය ජාතිකයෙකු විසින්. වැවිලි කෘෂිකර්මය ම ඉලක්ක කරගනිමින් ආරම්භ කරන ලද මෙම බැංකුව කෝපි වගාවේ පරිහානියත් සමඟ ම වැසී ගියා. 1843 දී බොම්බායේ ඔරියන්ටල් බැංකුවේ ශාඛාවක් ලංකාවේ විවෘත කර තිබෙනවා. එම ඔරියන්ටල් බැංකුව සහ බෑන්ක් ඔෆ් සිලෝන් ඒකාබද්ධකර ඔරියන්ටල් බෑන්ක් කෝපරේෂන් නමින් නව බැංකුවක් 1851 දී පිහිටුවා තිබෙනවා. ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පැවති මෙම බැංකු අතරට 1850 ගණන්වල ඉන්දියාවේ මර්කන්ටයිල් බැංකුවේ ශාඛාත් එක්වී තිබෙනවා. පසුව මෙම බැංකුව චාර්ටඩ් මර්කන්ටයිල් බැංකුව ලෙස හැඳින්වුවා. 1867 බෑන්ක් ඔෆ් මැඩ්‍රාස් ද 1881 දී නැෂනල් බෑන්ක් ඔෆ් ඉන්දියා ද 1885 දී නිව් ඔරියන්ටල් බෑන්ක් කෝපරේෂන් ද ලංකාවේ ශාඛා විවෘත කළා. 1892 වසරෙහි චාර්ටඩ් බෑන්ක් ඔෆ් ඉන්දියා, චයිනා ඇන්ඩ් ඔස්ට්‍රේලියා සහ හොංකොං ඇන්ඩ් ෂැංහයි කෝපරේෂන් ලංකාවේ ව්‍යාපාරික කටයුතු අරඹා තිබෙනවා. ඒත් චාර්ටඩ් බෑන්ක් ඔෆ් ඉන්දියා පසුව ව්‍යාපාරික කටයුතු නතර කර දැමීමට පියවර ගත්තා. එය 1893 දී මර්කන්ටයිල් බෑන්ක් ඔෆ් ඉන්දියා නමින් යළිත් කටයුතු ආරම්භ කළා.


## නිදහස නො ලද ලංකා රුපියල

මුදල් මණ්ඩල ක්‍රමය යටතේ ක්‍රියාත්මක වුනේ ඉන්දියානු රුපියල සංචිත ව්‍යවහාර මුදලක් වශයෙන් ගැනුනු සියයට සියයේ සංචිත ක්‍රමයක්. ඉන්දියාව ඔවුන්ගේ සංචිත පවත්වාගෙන ගියේ ස්ටර්ලින් පවුම්වලින්. මේනිසා මෙම ක්‍රමය යටතේ ලංකා රුපියල ඉන්දියානු රුපියල සමඟ සෘජුවත් ඒ හරහා ස්ටර්ලින් පවුම සමඟ වක්‍රවත් බැඳී පැවතුනා. එහි වටිනාකම ඉන්දියානු රුපියලට හා රන් පවුමට අදාළව ස්ථාවරව පැවතුනා. ලංකා රුපියල් කාසි හා නෝට්ටු නිකුත් කළ හැකි වූයේ ව්‍යවහාර මුදල් මණ්ඩලය සතුව පැවතුනු හෝ ඉන්දීය සංචිත බැංකුවේ තැන්පත් කරන ලද හෝ ඉන්දියානු රුපියල්වල අගයට සමාන ප්‍රමාණයක්. ඉන්දියානු රුපියල්වලින් ලංකාවේ පැවතුනු රුපියල් සංචිත ප්‍රමාණය වැඩිවූ විට පමණක් ලංකා රුපියල් නිකුතුව ප්‍රසාරණය වූ අතර ඉන්දියානු රුපියල් සංචිත ප්‍රමාණය අඩුවූ විට ලංකා රුපියල් නිකුතුව සංකෝචනය වුණා. මේ නිසා මුදල් සැපයුම ගෙවුම් තුලනය සමඟ ස්වයංක්‍රීයව සෘජුව බැඳී පැවතුනා. එහි අතිරික්තයක් පැවතුනු විට, එනම් රටේ විදේශ විනිමය ලැබීම් විදේශ විනිමය ගෙවීම්වලට වඩා වැඩි වූ විට එම අතිරික්තයේ ප්‍රමාණයෙන් ලංකා ව්‍යවහාර මුදල් නිකුතුව ස්වයංක්‍රීයව ප්‍රසාරණය වුණා. අනෙක් අතට ගෙවුම් තුලනයේ හිඟයක් පවතින විටෙක ලංකා ව්‍යවහාර මුදල් නිකුතුව ස්වයංක්‍රීයව සංකෝචනය වුණා. ඊට පරිබාහිර ව යමින් ආර්ථිකයේ අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි මුදල් නිකුත් කිරීමට හෝ පාලනය කිරීමට හෝ නොහැකි තත්ත්වයකුයි එවකට පැවතුනේ. මේ නිසා ව්‍යවහාර මුදල් නිකුතුව ප්‍රසාරණය හා සංකෝචනය වීම සම්බන්ධයෙන් ව්‍යවහාර මුදල් මණ්ඩලයට සක්‍රීය කාර්යභාරයක් තිබුණේ නැහැ. එය ඉන්දියානු රුපියල හා සම වටිනාකමකින් බැඳී තිබුණු බැවින් ලංකා රුපියල සඳහා ජාත්‍යන්තර වටිනාකමක් නියම කිරීමටවත්, පවත්වා ගැනීමටවත් ලංකාවේ බලධාරීන්ට හිමිකමක් හෝ හැකියාවක් හෝ තිබුණේ නැහැ. ව්‍යවහාර මුදල් මණ්ඩලයේ පැවතුණු මෙවැනි නොයෙකුත් සීමා, දුර්වලතා හා අඩුපාඩු නිසා ආර්ථික කටයුතු පුළුල්වීමට තිබුණු ඉඩකඩ හා මංපෙත් ඇහිරී පැවතුනා.

20 වැනි ශත වර්ෂයේ දෙවන දසකය වන විට ලංකා ව්‍යවහාර මුදල් මණ්ඩලයට ගෝලීය කැළඹීම් කිහිපයකට මුහුණ දෙන්නට සිදුවුණා. ඉන් පළමුවැන්න 1914 ඇරඹී පළමු වැනි ලෝක යුද්ධය යි. අනතුරුව 1929-32 මහා ලෝක අවපාතයට මුහුණපෑමට සිදුවුණා. එයින් ලංකාවේ වෙළෙඳ අනුපාතය පිරිහුනා. විදේශ සංචිත සිඳීගියා. මුදල් සැපයුම සංකෝචනය වුණා.

## ස්වදේශීය ධනපති පංතියක බිහිවීම

කටයුතු මෙසේ සිදුවෙද්දී එම අවධිය වන විට ඉංග්‍රීසි උගත් ස්වදේශීය ධනපති පංතියක් ද ලංකාවේ බිහිව සිටියා. ඔවුනුත් වැවිලි කෘෂිකර්මයට අවතීර්ණ වී සිටියා. එහෙත් වැවිලි කෘෂිකර්මය වූ කලී විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය කටයුත්තක්. විදේශිකයන්ට මෙන් නොව ස්වදේශිකයන්ට පැවති බැංකු ක්‍රමය තුළ ණය ලබා ගැනීම පහසු කටයුත්තක් වුනේ නැහැ. ඔවුනට සෘජුව ම බැංකුවේ නිලධාරීන් සමඟ ගනුදෙනු කළ නොහැකි වූයෙන් අතරමැදි තැරැව්කරුවන්ට, ණය මුදල පිළිවෙළ කරන්නන්ට, ඒ පිළිබඳ වාර්තාව සපයන්නන්ට, ඔප්පු ලියන නොතාරිස්වරුන්ට ගෙවීම් කළ යුතු වුණා. අතරමැදියන් ලෙස කටයුතු කළේ හෙට්ටි බැංකුකරුවෝ. මොවුහු බැංකුවලින් ණය ලබාගෙන වැඩි පොලියක් යටතේ ඒවා දේශීය වෙළෙඳුන්ට හා වෙනත් අයට දුන්නා. එවකට පැවති බොහොමයක් බැංකු විනිමය බැංකු ලෙසයි සැලකුනේ. ඊට හේතුව ඒවා විදේශ වෙළෙඳ



කටයුතුවල නියුතු වීම යි. ඒවායින් කෘෂිකර්මය වැනි දිගුකාලීන කටයුතු සඳහා ණය දීමක් සිදු වුනේ නැහැ. ඉම්පීරියල් බෑංක් ඔෆ් ඉන්දියා බැංකුව තෝරා ගත් නිශ්චිත ජන කොටසකට පමණක් ණය දුන්නා. ඒ, එවකට ඉන්දියාවෙන් පැමිණ මෙහි පදිංචිව සිටි වෙළෙන්දන්ට යි. ලංකාවේ එවකට පැවති බැංකුවලින් බහුතරයක් අයත් වුනේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ට. ඊට හේතුව වැවිලි කෘෂිකර්මයේ නියුතු වූවෝ අති බහුතරයක් බ්‍රිතාන්‍ය ජාතිකයන් වීම යි. අනෙක් අතට උක්ත කාල වකවානුව වන විට ලංකාව වෙනත් රටවල් සමඟ කළ වෙළෙඳාම් කටයුතු බොහෝ දුරට අඩාලවයි පැවතුනේ. ඉන්දියාවෙන් ආහාර හා රෙදිපිළි ආදිය ආනයනය කළත් විදේශ වෙළෙඳාම බෙහෙවින් බැඳී පැවතියේ බ්‍රිතාන්‍ය සමඟයි. දේශීය ව්‍යාපාරිකයන්ට ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට තිබූ දුෂ්කරතා පිළිබඳ ව 1932 නොවැම්බර් 23 දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මහනුවර මන්ත්‍රී ජෝර්ජ් එඩ්මන්ඩ් ද සිල්වා දීර්ඝ විස්තරයක් කර තිබෙනවා. ඔහු දේශීය ව්‍යාපාරිකයන් ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට හැකි ආකාරයෙන් ණය ලබාගත හැකි දේශීය බැංකුවක් පිහිටුවීම පිළිබඳ යෝජනාවක් ගෙන ආවා. ඒ අනුව එවකට ලංකාවේ පැවති බැංකු කටයුතු සහ ණය සම්පාදනයේ ස්වරූපය පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට බලධාරීන් විසින් කොමිසමක් පත්කළා. කොමිසමේ සභාපති වූයේ ශ්‍රීමත් සොරාබ්ජී නුසර්වන්ජී පොච්ඛනවාලා. ඔහු ඉන්දීය ජාතික විද්වතෙක්. බැංකුකරුවෙක්. සෙසු සාමාජිකයන් වූයේ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු සහ දොස්තර එස් සී පෝල්. මොවුන් ඉදිරිපත් කළ වාර්තාව මඟින් විනිමය බැංකුවලින් දේශීය ව්‍යාපාරිකයන්ට ණය සැපයීමේ දී සිදුවූ වෙනස්කම් පිළිබඳව විස්තර කර තිබෙනවා. 1939 අගෝස්තු 01 දින ලංකාවේ පළමු වැනි දේශීය බැංකුව වූ ලංකා බැංකුව පිහිටුවන ලද්දේ මෙම සොරාබ්ජී නුසර්වන්ජී පොච්ඛනවාලා කොමිසමේ නිර්දේශ මත පදනම් වෙමින්. ඒ 1939 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත යටතේ.

මෙසේ ලංකාවේ බැංකු ක්‍රමය පුළුල් වෙමින් පවතිත් දී 1944 ව්‍යවහාර මුදල් පනත මඟින් ලංකා රුපියල සෘජුව ස්ටර්ලින් පවුම සමඟ හුවමාරු කිරීමේ බලය මුදල් මණ්ඩලයට ලැබුණා. එහෙත් එය ක්‍රියාවට නැංවී නැහැ. 1946 දී ඉන්දීය අධිකාරීහු ඉන්දියානු රුපියල සඳහා රන් අගයක් දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එකඟ වුණා. එයින් රන් පවුම සමග ඉන්දියානු රුපියලේ පැවති බැඳීම අවසන් වුණා. මේ මඟින් ඉන්දියානු රුපියලට ස්වාධීන අගයක් ලැබුණා. පසුව 1947 දී ඉන්දියාවත් 1948 දී ලංකාවත් රන් පවුම් කලාපයෙන් අනිත් රටවල් සමඟ කෙරෙන ගනුදෙනු වෙනුවෙන් විනිමය පාලනයක් ඇති කළා.

1949 රන් පවුම අවප්‍රමාණය කිරීමට බ්‍රිතාන්‍ය රජය ගත් තීරණයත් සමඟ ම ලංකා රුපියල හා ඉන්දියානු රුපියල අතර බැඳීම නැති කිරීම සඳහාත් ලංකා රුපියලට රන්වලින් අගය නියම කිරීම සඳහාත් ව්‍යවහාර මුදල් පිළිබඳ ආඥා පනත සංශෝධනය කළ යුතු වුණා.

මෙවැනි පසුබිමක් තුළ මේ කාලය වන විට ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී අවශ්‍ය උපදෙස් දීමටත් මඟ පෙන්වීම සඳහාත් ශක්තිමත් ස්වෛරී මූල්‍ය ආයතනයක අවශ්‍යතාව රට තුළ තදින් ඉස්මතුවී තිබුණා. ඒ අනුව අවුරුදු 65 ක් තරම් කාලයක් තිස්සේ පැවති ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය වෙනුවට මහ බැංකුවක් පිහිටුවීම පිළිබඳ මතයක් ගොඩ නැංවුණා.

## ශ්‍රී ලංකා මහ බැංකුව ඉපදෙයි...

ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලද්දේ 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ යි. එය ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන කේන්ද්‍රීය ආයතනය යි.

මහ බැංකුව පිහිටුවන ලද්දේ 1950 වුවත් ඒ පිළිබඳ ඉතිහාසය 1940 ගණන්වල මුල් භාගය තෙක් දිවයනවා. මේ සම්බන්ධ යෝජනාව 1945 නොවැම්බර් 07 වැනි දින රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකු ඉතිහාසය තුළ සුවිශේෂී සිදුවීමක්. යෝජනාව ගෙන ආයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්නාරම් - මුලතිව් මන්ත්‍රී ජේ ත්‍යාගරාජා මහතා විසින්. එවකට මුදල් විෂය භාර අමාත්‍යවරයා වූයේ ජේ ආර් ජයවර්ධන මහතා. මහ බැංකුවක් පිහිටුවීම පිළිබඳව ඉදිරිපත්වූ යෝජනාව සම්බන්ධව බොහෝ සාකච්ඡා හා වාදවිවාද පැනනැඟුනා. අනතුරුව ලංකාව සඳහා මහ බැංකුවක් පිහිටුවීමට යෝජනා සම්මත කොටගත්තා. එවැනි ආයතනයක් පිහිටුවීමට මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ දැනුමින් හා අත්දැකීම්වලින් පරිපූර්ණ අයෙකුගේ උපදෙස් හා සහයෝගය ලබාගතයුතු වුණා. මේ නිසා යෝජිත මහ බැංකුව පිළිබඳ වාර්තාවක් සැකසීමට විශේෂඥ සහාය ලබාගැනීමට තීරණය කෙරුනා. ඒ අනුව ලංකාණ්ඩුව 1948 ජූලි මස මහ බැංකුවක් පිහිටුවීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා ෆෙඩරල් සංචිත ක්‍රමයේ ජ්‍යෙෂ්ඨ බැංකුකරුවෙකු ගේ සේවය එක්සත් ජනපද ආණ්ඩුවෙන් ඉල්ලා සිටියා. ෆෙඩරල් සංචිත ක්‍රමයේ පාලක මණ්ඩලය ඔවුන් ගේ අර්ථශාස්ත්‍රඥයෙකු වූ ජෝන් එක්ස්ටර් මහතා උපදේශකයෙකු ලෙස ලංකාවට එවීමට නිර්දේශ කළා. ඔහු පිලිපීනයේ මහ බැංකුව පිහිටුවීම සම්බන්ධව කටයුතු කළ අයෙක්. 1948 දෙසැම්බර් 28 දින ජෝන් එක්ස්ටර් ලංකාවට පැමිණියා. ඔහු ගේ මූලික කාර්යය වූනේ මහ බැංකුවක් පිහිටුවීම පිළිබඳ කරුණු සොයා බලා අදාළ කෙටුම්පත් සෑදීම යි.

කර්තව්‍ය ඇරඹීමේ මූලික පියවරක් ලෙස ඔහු මහ බැංකුව පිහිටුවීම පිළිබඳ මහජන මතය විමසා බැලුවා. ඕනෑම අයෙකුට යෝජනා ඇත්නම් ලිඛිත ව ඒවා ඉදිරිපත් කරන ලෙස දන්වමින් 1949 ජනවාරි 5 දින පුවත් පත් දැන්වීම් මාලාවක් භාෂා තුනෙන් ම පළ කිරීමට පියවර ගත්තා. එහෙත් මේ සම්බන්ධව සැලකිය යුතු ප්‍රතිචාරයක් ලැබී නැහැ.

ජෝන් එක්ස්ටර්, යෝජිත මහ බැංකුව පිළිබඳව මාස 6 ක් ඇතුළත අතුරු වාර්තාවක් සකසා එය 1949 ජූනි මස 07 දින ඉදිරිපත් කළා. එහි මූල්‍ය ක්‍රමය, යෝජිත මහ බැංකුවේ සංවිධානය, මූල්‍ය පරිපාලනයේ මූලධර්ම පිළිබඳ මඟ පෙන්වන මූලික නිර්දේශ ඇතුළත් වුණා.

අනතුරුව Report on the Establishment of Central Bank of Ceylon යනුවෙන් කොටස් දෙකකින් යුතුව කෙටුම්පත් කරන ලද අවසන් වාර්තාව 1949 නොවැම්බර් 04 වැනි දින ලංකා

රජයට ඉදිරිපත් කළා. වාර්තාවේ පළමු වැනි කොටසින් ලංකා ආර්ථිකයට මහ බැංකු ක්‍රමයක ඇති වැදගත්කම පිළිබඳ විස්තර කෙරුණු අතර, දෙ වැනි කොටස කෙටුම්පත් පනතකින් සමන්විත වුණා. එහි අවශ්‍ය තැන්වල එක් එක් වගන්තිය නිර්දේශ කිරීමේ හේතු ද දක්වා තිබුණා. එම වාර්තාවෙන් ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය බෙහෙවින් විවේචනයට ලක් කෙරුණා. ප්‍රසාරණය වන ආර්ථිකයක අවශ්‍යතා සපුරාලීමෙහි ලා එම ක්‍රමය ප්‍රමාණවත් නොවන බව ඉන් පැහැදිලි කෙරුණා. සමස්ත මුදල්, බැංකු සහ ණය ක්‍රමය පරිපාලනය හා හැසිරවීම සඳහා පුළුල් බලතල සහිත ස්වාධීන මූල්‍ය අධිකාරියක් අත්‍යාවශ්‍යයෙන් ම පිහිටුවිය යුතු බව එක්ස්ටර් වාර්තාවෙන් නිර්දේශ කළා.

වාර්තාව ප්‍රකාශයට පත් වූ පසුව ඊට එරෙහිව සහ පක්ෂපාතීව නොයෙකුත් අදහස් පළ වුණා. මේ කාලවකවානුව වන විට මහ බැංකු පිළිබඳ සංකල්පය සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ආගන්තුක වූවක්. මේ සම්බන්ධයෙන් සංවර්ධිත රටවල මිස සංවර්ධනය වෙමින් පවත්නා රටවලින් ලබාගත හැකි පූර්වාදර්ශ තිබුණේ නැහැ. ඇතැම් විද්වතුන් ගේ අදහස වුණේ පුළුල් මුදල් වෙළෙඳපොළක් නොමැති ලංකාව සඳහා ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය වුවමනාවටත් වඩා ප්‍රමාණවත් වන බව යි. කොහොම වුණත් ලංකාව සඳහා නව ව්‍යවහාර මුදල් ක්‍රමයක් පරිපාලනය කිරීම සහ හැසිරවීම පිණිස මහ බැංකුවක් පිහිටුවීමේ ව්‍යවස්ථා අඩංගු මුදල් නීති කෙටුම්පත 1949 නොවැම්බර් මස රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කෙරුණා. පාර්ලිමේන්තු විවාදයේ දී එක්ස්ටර් වාර්තාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දෙපක්ෂයේ ම ප්‍රශංසාවට ලක් වුණා. සතියක පමණ කාලයක් මුදල් නීති පනත දෙ වැනි වර කියවීම පිළිබඳ විවාදය පැවතුනා. අවසානයේ නොවැම්බර් මස 25 වැනි දින එය රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් සම්මත කළා. ඒ අනුව 1949 අංක 58 දරන මුදල් නීති පනත ලෙස නීතිගත කෙරුණු මෙම පනත පදනම් කර ගනිමින් පිහිටවූ මහ බැංකුව 1950 අගෝස්තු මස 28 දින සිය කටයුතු ආරම්භ කළා. ඒ සමගම එතෙක් පැවති ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය අහෝසි වුණා. ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය විසින් නිකුත් කරන ලදුව එදිනට සංසරණයේ පැවති නෝට්ටු සහ කාසි මහ බැංකුවේ වගකීම් බවට පත්වුනා. නිකුත් නො කළ කාසි හා නෝට්ටු තොගය ව්‍යවහාර මුදල් මණ්ඩලය වෙතින් මහ බැංකුව යටතට ගත්තා. මුදල් නීති පනතේ 49 වැනි වගන්තිය යටතේ ලංකාවේ මුදල් නිකුත් කිරීමේ බලය මහ බැංකුව වෙත පැවරුනා. එමෙන් ම ලංකා රුපියල ලංකාවේ සම්මත මුදල් ඒකකය බවට පත් වුණා. එහි සම අගය පිරිසිදු රත්තරන් ග්‍රෑම් 0.888671 ක් වශයෙන් නියම කෙරුණා. (ස්ටර්ලින් පවුම් 1 = රුපියල් 13.33, ඇ.එ.ජ. ඩොලර් 1 = රුපියල් 4.762)



මහ බැංකුවේ ප්‍රථම අධිපති ධූරයට පත්වූයේ එහි නිර්මාතෘවරයා වූ ජෝන් එක්ස්ටර් මහතා යි.

මුදල් නීති පනත අනුව ලිත් වර්ෂය මහ බැංකුවේ මුදල් වර්ෂය යි. 1950 අගෝස්තු 29 දින සිට එතෙක් නිශ්කාෂණ බැංකුව වශයෙන් කටයුතු කළ ඉන්දියානු ඉම්පීරියල් බැංකුව වෙතින් මහ බැංකුව නිශ්කාෂණ ආයතනයේ පාලනය සියතට ගත්තා.

1950 වසරෙහි මහ බැංකුව පිහිටුවන ලද අවස්ථාවෙහි එය දෙපාර්තමේන්තු 5 කින් සමන්විත වුණා. ඒවා,

1. බැංකු සහ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
2. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
3. විනිමය පාලන දෙපාර්තමේන්තුව
4. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
5. ලේකම් දෙපාර්තමේන්තුව

ආරම්භයේ දී බැංකු සහ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ලෙසින් හැඳින්වුණ දෙපාර්තමේන්තුව අද හැඳින්වෙන්නේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ලෙසින්. ව්‍යවහාර මුදල් කළමනාකරණය පැවරී තිබෙන්නේ මේ දෙපාර්තමේන්තුවට. ආර්ථිකයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය ව්‍යවහාර මුදල්වල වටිනාකම හා මුදල්වල ඒකීයභාවය පිළිබඳ මහජන විශ්වාසය ගොඩ නංවා පවත්වාගෙන යෑම හා ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත්වන පරිදි තොග පවත්වාගෙන යෑම ව්‍යවහාර මුදල් කළමනාකරණයේ පරමාර්ථය යි.

1951 වර්ෂය වන තුරු ම අප භාවිතයට ගත්තේ ඉංග්‍රීසීන් විසින් නිකුත් කළ නෝට්ටුම යි. එමෙන් ම 1963 වන තුරු ම භාවිත කළේ ඔවුන් නිකුත් කළ කාසි ම යි. 1951 සහ 1955 වර්ෂ සඳහන් කාසි නිකුත් කර ඇතත් ඒවා ඊට පෙර ටංකනය කරන ලද කාසි කාණ්ඩවලට ම අයත් ඒවා ලෙස සැලකිය හැකි යි.

## නිදහසින් පසු පළමු කාසිය සමරු කාසියක්

1957 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල හා රුපියල් 5 වටිනාකමින් යුත් සමරු කාසි දෙකක් නිකුත්කර තිබෙනවා. ඒවා ටංකනය කරවා තිබෙන්නේ එංගලන්තයේ රාජකීය ටංකනය මගින්. මෙම කාසි දෙක සංසරණය සඳහා වූ කාසි දෙකක්.



## පළමු කාසි කාණ්ඩය

ශ්‍රී ලංකා මහ බැංකුව තම පළමු වැනි කාසි කාණ්ඩය හඳුන්වා දුන්නේ 1963 වර්ෂයේ. මෙම කාසි කාණ්ඩයේ මුහුණතේ

නිරූපණය කෙරුනේ ලංකාවේ රාජ්‍ය ලාංඡනය. එම පළමුවැනි කාසි කාණ්ඩය; සතය, සත දෙක, සත පහ, සත දහය, සත විසිපහ, සත පනහ, සහ රුපියල යන වටිනාකම්වලින් සමන්විත වුණා.

### ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය සමඟින් කාසි

කාසි නිර්මාණයේ ප්‍රධාන වෙනසක් සිදුවූයේ 1972 වර්ෂයේ. ඒ ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය කාසිවල මුහුණතෙහි සඳහන් කිරීම යි. එමෙන් ම 1963 දී ටංකනය කළ කාසිවල පිටුපසෙහි සඳහන් වූ "ලංකා" යන්න මෙම කාසි කාණ්ඩයේ දී "ශ්‍රී ලංකා" ලෙසින් වෙනස් වුණා.




### නෝට්ටු වෙනුවට කාසි

1984 දී එවකට සංසරණයේ පැවති රුපියල් 2 සහ 5 නෝට්ටු වෙනුවට රුපියල් 2 සහ 5 කාසි නිකුත් කළා. රුපියල් 2 කාසිය නිර්මිත වුනේ කොපර් - නිකල් ලෝහයෙන්. රුපියල් 5 නිර්මිත වූයේ නිකල් - පිත්තලවලින්.




### බරින් අඩු කාසි



2005 වර්ෂයේ දී ප්‍රමාණයෙන්, බරින්, ලෝහ වර්ගයෙන් හා වර්ණයෙන් වෙනස් වූ නව කාසි කාණ්ඩයක් ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දුන්නා. එම කාසි කාණ්ඩයේ රුපියල් 5, 2, රුපියල, සත 50 හා සත 25 යන කාසි නිපදවා ඇත්තේ වානේ මත ආලේපිත වූ විවිධ ලෝහ වර්ගවලින්.

ශ්‍රී ලංකාවේ පළමු වතාවට රුපියල් 10 වටිනාකමින් යුත් ඒකාදසාස්‍ර හැඩති නිකල් ආලේපිත වානේ කාසියක් සංසරණය සඳහා නිකුත් කළේ 2010 වර්ෂයේයි. කාසියේ සඳහන් වෙන්නේ 2009 වර්ෂය. අනෙකුත් නෝට්ටු හා සාපේක්ෂ ව ගත් විට දැනටත් භාවිතයේ පවතින රුපියල් 10 නෝට්ටුවට ඇත්තේ ඉතා අඩු ආයු කාලයක්. එමනිසා රුපියල් 10 කාසිය ඊට කදිම අදේශකයක් වෙනවා ඇති.

## එදා මෙදා තුර මහ බැංකුව විසින් නිකුත් කර ඇති නෝට්ටු

### උපන් ගෙයි ම මිය ගිය නෝට්ටු

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රථම නෝට්ටු කාණ්ඩය නිකුත් කළේ 1951 වසරේ. ඒ නෝට්ටු කාණ්ඩයේ තේමාව වුනේ හයවන ජෝර්ජ් රජුගේ රුව යි. 1951 ජනවාරි 20 දාතමින් යුතුව 1952 ජනවාරි 04 වැනි දින නිකුත් කරන ලද එම නෝට්ටු කාණ්ඩය රුපියල සහ රුපියල් 10 නෝට්ටුවලින් සමන්විත වුණා. නෝට්ටු කාණ්ඩය රුපියල, රුපියල් 2, 5, 10, 50 සහ 100 වටිනාකම් සහිත නෝට්ටුවලින් යුතු ව නිකුත් කිරීමටයි කලින් සැලසුම්කර තිබුණේ. එහෙත් සැලසුම ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලැබුනේ නැහැ. රුපියලේ සහ රුපියල් 10 නෝට්ටුව හැරුනු විට අනෙකුත් නෝට්ටු මුද්‍රණය වෙමින් පවතිද් දී රජය විසින් එම නෝට්ටු නිකුත් නොකිරීමට තීරණය කළා. එමනිසා ඉතිරි නෝට්ටු සියල්ල ආදර්ශක නෝට්ටු (Proof Notes) පමණක් බවට පත් වුණා.








## ඊට හේතුව කුමක් ද?

මේ වන විට ලංකාව නිදහස ලබා තිබුණත් එය පූර්ණ නිදහසක් වුණේ නැහැ. බ්‍රිතාන්‍ය කිරීටය නියෝජනය කරන අග්‍රාණ්ඩුකාරයෙක් මෙහි සිටියා. ඒ වන විට බ්‍රිතාන්‍ය කිරීටය දැරුවේ හය වැනි ජෝර්ජ් රජු යි. ඔහු නියෝජනය කරමින් අප රටේ අග්‍රාණ්ඩුකාර ධූරය දැරුවේ ශ්‍රීමත් හෙන්රි මන්ක් මේසන් මුවර්. මහ බැංකුව විසින් නිකුත් කරන්නට යෙදුනු පළමු වැනි මුදල් නෝට්ටු කාණ්ඩයට ජෝර්ජ් රජුගේ රුව ඇතුළත් කිරීමට සැලසුම් කරන ලද්දේත් එම නිසයි. එහෙත් නෝට්ටු කාණ්ඩය එසේ සැලසුම් කොට තිබිය දී එවකට 56 වැනි වියේ සිටි ජෝර්ජ් රජු, 1952 වසරේ පෙනහලු පිළිකාවකින් මිය ගියා. එම නිසයි ඒවන විට සැලසුම් කර තිබූ නෝට්ටු කාණ්ඩයෙන් නෝට්ටු වර්ග දෙකක් පමණක් නිකුත්කර තිබෙන්නේ. එම නෝට්ටු වර්ග දෙකෙහි ම මුහුණත හය වැනි ජෝර්ජ් රජුගේ රුව ඇතුළත් වන අතර රුපියලේ නෝට්ටුවේ අනෙක් පස අනුරාධපුර සඳකඩ පහණක් සහ පියගැට පෙළක් ඇතුළත්. රුපියල් 10 නෝට්ටුවේ පසුපස අනුරාධපුරයේ මුර ගලක් ද නිරූපණයකර තිබෙනවා.




2 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

**මහ බැංකුව පිහිටවූ දා සිට 2013 වර්ෂය දක්වා මුදල් නෝට්ටු කාණ්ඩ එකොළහක් නිකුත්කර තිබෙනවා.**

## කිරීටය සමඟින්

දෙවන එලිසබත් රැජිණගේ රුව සහිත නෝට්ටු කාණ්ඩය මහ බැංකුව නිකුත් කළ 2 වැනි **මුදල් නෝට්ටු කාණ්ඩය** යි. ඒ තුළින් ද අප බ්‍රිතාන්‍ය කිරීටයෙන් මුලුමනින් ම නිදහස්වී නොමැති බව නිරූපිත යි. එය නිකුත් කළේ 1952 වර්ෂයේ. නෝට්ටු කාණ්ඩය රුපියල, රුපියල් 2, 5, 10, 50 සහ 100 වටිනාකම්වලින් සමන්විත වුණා. සෑම නෝට්ටුවකම මුහුණත දෙ වැනි එලිසබත් රැජිණගේ රුව නිරූපණය කෙරුණු අතර නෝට්ටුවල පිටුපස සඳහන් වූයේ ලංකාවේ ඓතිහාසික ස්ථානවල රූ සටහන්. ඒ අනුව;

| | |
|---|---|
| රුපියල | - අනුරාධපුරයේ සඳකඩ පහණක් සහ පියගැට පෙළක්. |
| රුපියල් 2 | - මැදිරිගිරිය වටදාගෙය |
| රුපියල් 5 | - මහා පරාක්‍රමබාහු රජතුමාගේ පිළිරුව |
| රුපියල් 10 | - අනුරාධපුරයේ මුරගලක් |
| රුපියල් 50 | - අනුරාධපුරයේ සඳකඩ පහණක් |
| රුපියල් 100 | - සීගිරි බිතුසිතුවම් |

මෙම මුදල් නෝට්ටු කාණ්ඩයේ ප්‍රධාන ආරක්ෂිත ලකුණ ලෙස යොදා ඇත්තේ ව්‍යවහාර මුදල් මණ්ඩලය මුල් කාලයේ නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල වූ සිංහ සලකුණ යි.




3 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

## යුගයක පෙරළිය නෝට්ටුවට

මහ බැංකුව සිය **3 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** නිකුත් කළේ 1956 වර්ෂයේ දී. එහි තේමාව වුනේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය යි. එම නෝට්ටු කාණ්ඩයත් රුපියල, රුපියල් 2, 5, 10, 50 සහ 100 වටිනාකම්වලින් යුතු වුණා.

මෙම නෝට්ටු කාණ්ඩයේ සෑම නෝට්ටුවකම මුහුණත ලංකාවේ රාජ්‍ය ලාංඡනය නිරූපණය කර තිබුණු අතර නෝට්ටුවල පසුපස ඊට පෙර නිකුත් කරන ලද නෝට්ටු කාණ්ඩයේ වූ රූ සටහන් ම ඇතුළත් කර තිබුණා.

මෙම නෝට්ටු කාණ්ඩයේ දැකිය හැකිවූ සුවිශේෂ ලක්ෂණයක් වූයේ එවකට සිදුවූ දේශපාලන පෙරළිය මෙම නෝට්ටුවලින් ද නිරූපණය වීමයි. ඒ අනුව එතෙක් ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් වූ Central Bank of Ceylon යන්න "ශ්‍රී ලංකා මහ බැංකුව" ලෙසටත් එතෙක් මුදලේ වලංගුභාවය පිළිබඳව ඉංග්‍රීසියෙන් වූ සඳහන "ශ්‍රී ලංකාණ්ඩුව වෙනුවෙන් නිකුත් කරන ලද මේ මුදල් නෝට්ටුව ලංකාව ඇතුළත ඕනෑම මුදල් ගණනක් ගෙවීම සඳහා නීතියෙන් වලංගුය" ලෙසින් සිංහලයට පෙරළී තිබෙනවා. එමෙන් ම යටත් විජිත පාලකයින්ගේ රූ සටහන් ඉවත් කරමින්, නිදහස් ශ්‍රී ලංකාව පිළිබඳ අදහස නිරූපණය වන සේ ලංකාවේ රාජ්‍ය ලාංඡනය




4 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

ඇතුළත් කොට නිකුත් කරන ලද ප්‍රථම නෝට්ටු කාණ්ඩය ද මෙයයි.

**4 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළේ දිවංගත අග්‍රාමාත්‍ය එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක අග්‍රාමාත්‍යවරයාගේ රූපය ඇතුළත් 1962 වර්ෂය සඳහන් නෝට්ටු කාණ්ඩය යි. මෙම නෝට්ටු කාණ්ඩය රුපියල් 2, 5, 10, 50 සහ 100 නෝට්ටුවලින් සමන්විත වුණා.

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයෙකුගේ රුව රැගත් පළමුවැනි නෝට්ටු කාණ්ඩය මෙය යි.

නෝට්ටුවල මුහුණත හිටපු අග්‍රාමාත්‍ය දිවංගත එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මැතිතුමාගේ රූපය ඇතුළත්.

නෝට්ටුවල පසුපස සඳහන් වූ රූ සටහන්;

| | | |
|---|---|---|
| රුපියල් 2 | - | මැදිරිගිරිය වටදාගෙය |
| රුපියල 5 | - | මහා පරාක්‍රමබාහු රජතුමාගේ පිළිරුව |
| රුපියල් 10 | - | අනුරාධපුරයේ මුරගලක් |
| රුපියල් 50 | - | විහාර මහා දේවියගේ පිළිරුව සහ නුග ගසක් |
| රුපියල් 50 | - | ශ්‍රී පාද කන්ද පසුබිම්කර ගත් තේ වත්තක් |
| රුපියල් 100 | - | බෙරකරුවෙක් සහ උඩරට නැටුම් ශිල්පීන් තිදෙනෙක් |
| රුපියල් 100 | - | පොළොන්නරුව මැදිරිගිරියේ වටදාගෙය |



5 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

මෙම නෝට්ටු කාණ්ඩය යටතේ නිකුත් කරන ලද ඇතැම් නෝට්ටුවලට යළිත් ඉංග්‍රීසි භාෂාවෙන් Central Bank of Ceylon යන්න ඇතුළත් කර ඇති අතර ඊට අමතරව இலங்கை மத்திய வங்கி ලෙස දෙමළ භාෂාවෙන් සඳහන් කර තිබීමත් සුවිශේෂ ලක්ෂණයක්.

මහා පරාක්‍රම බාහු රජතුමා ගේ පිළිරුව සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව සිය **5 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** නිකුත් කළේ 1965 වර්ෂයේ දී. එම නෝට්ටු කාණ්ඩයත් රුපියල් 2, 5, 10, 50 සහ 100 නෝට්ටුවලින් සමන්විත වුණා. සෑම නෝට්ටුවකම මුහුණත මහ පරාක්‍රමබාහු රජතුමාගේ පිළිරුව නිරූපණය කෙරුනා. මෙම නෝට්ටු කාණ්ඩය යටතේ නිකුත් කරන ලද ඇතැම් නෝට්ටුවල ද සිංහල භාෂාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව යන්න සඳහන් කරනවාට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් Central Bank of Ceylon යන්නත් දෙමළ භාෂාවෙන් இலங்கை மத்திய வங்கி යන්නත් සඳහන් කර තිබෙනවා.

## නෝට්ටුවල පසුපස ඇතුළත් රූ සටහන්

| | | |
|---|---|---|
| රුපියල් 2 | - | මැදිරිගිරිය වටදාගෙය |
| රුපියල් 5 | - | පොළොන්නරුවේ පිහිටි, නිශ්ශංකමල්ල රජු සමයේ රාජ්‍ය සභා ශාලාවේ සිංහාසනයට ආධාරකයක් ලෙස ගලින් නෙලන ලද සිංහ රූපයක් |
| රුපියල් 10 | - | අනුරාධපුරයේ මුරගලක් |
| රුපියල් 50 | - | අනුරාධපුරයේ සඳකඩ පහණක් |
| රුපියල් 100 | - | සීගිරි බිතුසිතුවම් |

## මුදල් ප්‍රතිස්ථාපනය

මේ පිළිබඳ ව සඳහන් වෙන්නේ මුදල් නීති පනතේ 56 වැනි වගන්තියේ. එයට අනුව සංසරණය සඳහා යෝග්‍ය නොවන මුදල් නෝට්ටු සහ කාසි සංසරණය සඳහා යෝග්‍ය නෝට්ටු සහ කාසි සමඟ හුවමාරු කිරීමට මහ බැංකුවට අවසර ලබා දී තිබෙනවා.

පනතේ 57 වැනි වගන්තියට අනුව ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයකින් යම් නිකුතුවකට අයත් මුදල් නෝට්ටු හා කාසි නැවත කැඳවනු ලැබිය හැකියි. එසේ ප්‍රතිස්ථාපනය සඳහා කැඳවනු ලබන නෝට්ටු හා කාසි එසේ කැඳවන ලද දිනයේ සිට වසරක කාලයක් තුළ වලංගු මුදල් ලෙස භාවිත කළ හැකි යි.

ව්‍යවහාර මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රුපියල් 50 සහ 100 මුදල් නෝට්ටු හැර අනෙකුත් මුදල් නෝට්ටු මහ බැංකුව විසින් නිකුත් කරන ලද මුදල් නෝට්ටු මඟින් 1955 මැද භාගයේ ප්‍රතිස්ථාපනය කළා. 1965 වර්ෂයේ නිකුත් කළ මුදල් නෝට්ටු කාණ්ඩය මඟින් පැවති මුදල් නෝට්ටු සියල්ල ම ප්‍රතිස්ථාපිත කෙරුණා.

## ආන්දෝලනාත්මක මුදල් නෝට්ටු අවලංගු කිරීම

1970 අංක 26 දරන බදු පැහැර හැරීමේ පනත යටතේ 1970 ඔක්තෝබර් 26 දින තෙක් නිකුත් වූ රුපියල් 50 සහ 100 වටිනාකමින් යුත් නෝට්ටු සියල්ල 1970 නොවැම්බර් 03 වැනි දිනෙන් පසු අවලංගු කෙරුනා. භාවිතයෙන් ඉවත් වූ නෝට්ටු වෙනුවට 1970 ඔක්තෝබර් 26 වැනි දාතමින් යුත් අලුත් නෝට්ටු ආදේශ කෙරුණා. මෙම නව මුදල් නෝට්ටුවල මුහුණතෙහි දිවංගත



අග්‍රාමාත්‍ය එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතාගේ රූපයක් ඇතුළත් කොට තිබුණා. එහෙත් ඒ ඊට පෙර අග්‍රාමාත්‍යවරයාගේ රුව රැගත් 4 වැනි මුදල් නෝට්ටු කාණ්ඩයේ දැක්වුන රූපය ම නො වේ. අත ඔසවාගත් ඉරියව්වෙන් සිටින රූපයක්. මෙම නෝට්ටු, නව නෝට්ටු කාණ්ඩයක් ලෙස නො ව ඊට පෙර මුද්‍රණය කරන ලද එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතාගේ රුව සහිත නෝට්ටු කාණ්ඩයට ම ඇතුළත් කළා.

## බ්‍රිතාන්‍ය කිරීටයෙන් මුලුමනින් ම නිදහස්

ශ්‍රී ලංකාව මුලුමනින් ම බ්‍රිතාන්‍ය කිරීටයේ බලයෙන් මිදුනේ 1972 මැයි 22 වැනි දා. එ දින සිට ක්‍රියාත්මක කරන්නට යෙදුනු 1972 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ජනරජය බිහි වුණා. ඒ සමඟ ම එතෙක් ලංකා රාජ්‍ය ලාංඡනය මුදුනෙහි ස්ථාපිත කොට තිබූ කිරීටය ඉන් ඉවත් කොට ඒ වෙනුවට ධර්ම චක්‍රය එහි ස්ථාපිත කෙරුණා. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ **6 වැනි නෝට්ටු කාණ්ඩය** ට ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය ඇතුළත් කෙරුණා. මෙම නෝට්ටු කාණ්ඩය සමන්විත වුණේ රුපියල් 50 සහ 100 වටිනාකම් සහිත නෝට්ටුවලින්. නෝට්ටුවල මුහුණත රාජ්‍ය ලාංඡනය නිරූපණය කෙරුණු අතර රුපියල් 50 නෝට්ටුවේ පසුපස ශ්‍රීපාද කන්ද පසුබිම්කර ගත් තේ වත්තක් ද රුපියල් 100 නෝට්ටුවේ පසුපස පොළොන්නරුව මැදිරිගිරියේ වටදාගෙයෙහි සඳකඩපහණ, මුරගල් සහ කොරවක් ගලක් (පඩිපෙලක්) පෙන්නුම් කරන දොරකඩ ද නිරූපණය කර තිබුණා.

## අසිරිමත් ජෛව විවිධත්වය සමඟින් රුපියල් 20 නෝට්ටුවක්

1979 නිකුත් කෙරුණේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරන ලද **7 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** යි. ඒ යටතේ මුදල් නෝට්ටුවල තේමාවෙහි විශාල වෙනසක් සිදුකළා. ඒ අනුව එම නෝට්ටු කාණ්ඩය අසිරිමත් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය නිරූපණය කරමින් වන සතුන් සහ වෘක්ෂ ලතා යන තේමාව යටතේ නිකුත් කෙරුනා. ශ්‍රී ලාංකික දක්ෂ සිත්තරෙකු වන ලකී සේනානායකගේ තෙලිතුඩින් හැඩ ගැන්වුන මෙම නෝට්ටු කාණ්ඩය ඉතාමත් ම ආකර්ෂණීය වුණා. නෝට්ටු කාණ්ඩය රුපියල් රුපියල් 2, 5, 10, 20, 50 සහ 100 වටිනාකම්වලින් සමන්විත වුණා. මේ කාලය වන විට රුපියල් 5 සහ 10 නෝට්ටු අතිනත සංසරණය වන වාර ගණන ඉතාමත් ම ඉහළ බැවින් ඒවා ඉක්මනින් සංසරණයට නුසුදුසු තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවක් තිබුණා. රුපියල් 20 වටිනාකමින් යුත් නෝට්ටුවක් හඳුන්වාදීමෙන් ඊට පිළියමක් ද මේ නෝට්ටු කාණ්ඩයෙන් ලැබුණා. එමෙන් ම ප්‍රථමවරට නෝට්ටුව පිටුපස සිරස් ආකෘතියකට නිර්මාණය කිරීම ද මෙම නෝට්ටු කාණ්ඩය යටතේ සිදු කළා.

## එම නෝට්ටුවල ඇතුළත් රූ සටහන්

### රුපියල් දෙක

මුහුණත - බුලත් හපයෙක්

පිටුපස - ඇට්ටේරියා ගසක්, පොළොන්හීරලුවෙක්, සමනළයෙක්




6 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

## රුපියල් පහ

මුහුණත - වන ලැහැබක්, යක් හුනෙක්, සමනළයෙක්

පිටුපස - බැදිදෙල් ගසක්, හම්බාවෙක්, සුදු හිසැති මයිනෙක්

## රුපියල් දහය

මුහුණත - ගල් සියඹලා ගසක්, අළු කෑඳැත්තෙක්

පිටුපස - ඩැෆඩිල් ඕකිඩ් (නගා මැරූ අල) මලක්, මාරත්මල් පොකුරක්, කහ කන් කොණ්ඩයෙක් (ගුරු කොණ්ඩයෙක්). ගස් ගෙම්බෙක්.

## රුපියල් විස්ස

මුහුණත - මහ වඳුරෙක්, වටපත් දඹ ගසක්, මයිලගොයෙක්

පිටුපස - ගිනිහොට ගසක්, කැහිබෙල්ලෙක්, අං කටුස්සෙක්, ලේමැඩිල්ලෙක්.

## රුපියල් පණහ

මුහුණත - මකුළු ගසක්, වන රතු මල් කොහෙක්, සමනළයෙක්

පිටුපස - හබන් කුකුළු ජෝඩුවක්, වෙසක් මල් ගොමුවක්, දියනා ගසක්, යක් කටුස්සෙක්



7 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

## රුපියල් සියය

මුහුණත - ලංකා සැළලිහිණි ජෝඩුවක්, ඇටඹ ගසක්, කලවැද්දෙක්, තල් ගසක්, පලා පොළඟෙක්

පිටුපස - රුක් (මලබොඩ) ගසක්, ශ්‍රී ලංකා රන්මුණත් කොට්ටෝරුවන් දෙදෙනෙක්, ලේන්තැරි ගසක්, සමනළයෙක්

## සාඩම්බර ඉතිහාසය සහ සංවර්ධනය සමඟින් රුපියල් 500 සහ 1000 නෝට්ටුත්

ඓතිහාසික සහ පුරා විද්‍යාත්මක තේමා රැගත් නෝට්ටු කාණ්ඩය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ **8 වැනි නෝට්ටු කාණ්ඩය** යි. එය නිකුත් කළේ 1981 වර්ෂයේ. එම නෝට්ටු කාණ්ඩය 5, 10, 20, 50, 100, 500 සහ 1000 වටිනාකමින් යුත් නෝට්ටුවලින් සමන්විතයි. ඒ අනුව මෙම නෝට්ටු කාණ්ඩය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් 500 සහ 1000 වටිනාකම්වලින් යුත් නෝට්ටු අප රටට හඳුන්වාදී තිබෙනවා. එය භාවිතය අධික වෙමින් පැවති රුපියල් 50 සහ 100 නෝට්ටුවලට හොඳ විකල්පයක් වුණා.









8 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

### එම නෝට්ටුවල ඇතුළත් රූ සටහන්

### රුපියල් 5

මුහුණත - පොළොන්නරුව වටදාගෙය

පසුපස - අනුරාධපුරයේ මුරගලක්

### රුපියල් 10

මුහුණත - මහනුවර ශ්‍රී දළදා මාළිගාවෙහි පත්තිරිප්පුව

පසුපස - කැළණි රජමහා විහාරයෙහි දාගැබ

### රුපියල් 20

මුහුණත - අනුරාධපුරයේ සඳකඩ පහණක් සහ කොරවක් ගලක්

පසුපස - අනුරාධපුර ථූපාරාම දාගැබ සහ උඩවැඩියා මල්

### රුපියල් 50

මුහුණත - කැළණි රජමහා විහාරය

පසුපස - පොළොන්නරුව ලංකාතිලක විහාරය

### රුපියල් 100

මෙම නෝට්ටුවෙහි මුහුණත ඓතිහාසික සහ පුරා විද්‍යාත්මක වටිනාකමින් යුත් අනුරාධපුරයේ කැටයම් සහිත ශිලාමය කොරවක්ගලක් නිරූපණය කළත් නෝට්ටුවේ පසුපස වූයේ ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල යි.

### රුපියල් 500

මුහුණත - ශ්‍රී දළදා මාළිගාවෙහි ඇති ගලින් නෙලන ලද ඇත් රූපයක්

පසුපස - අනුරාධපුර අභයගිරි ස්ථූපය, මල් ගොමුවක වසා සිටින කුරුල්ලෙක්, සමනළයෙක්

### රුපියල් 1000

මෙම නෝට්ටුව ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක තේමාව යටතට ගැනුනත් නෝට්ටුවේ මුහුණත නිරූපණය කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතියක්. ඒ මහවැලි ව්‍යාපෘතියට අයත් බෝවතැන්න ජලාශයෙහි වේල්ලේ සිතුවමක්. නෝට්ටුවේ පසුපස කන්තලේ වැව සහ විශාල මොණරෙක්.

## Central Bank of Ceylon, Central Bank of Sri Lanka බවට පෙරළෙයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ 9 **වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** ඓතිහාසික සහ සංවර්ධනය විදහා දැක්වීම යන තේමා යටතේ නිකුත් කෙරුණේ 1987 වර්ෂයේ. එම කාණ්ඩයට අයත් වුණේ රුපියල් 500 සහ 1000 නෝට්ටු යි. එතෙක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල එහි නම ඉංග්‍රීසියෙන් දැක්වුණේ Central Bank of Ceylon ලෙස යි. මෙම නෝට්ටු කාණ්ඩයේ සිට එය Central Bank of Sri Lanka බවට පෙරළුනා.

එමෙන් ම වැඩි දියුණු කරන ලද ආරක්ෂණ සලකුණු සමඟයි මෙම නෝට්ටු කාණ්ඩය නිකුත් කෙරුනේ.

## එම නෝට්ටුවල ඇතුළත් රූ සටහන්

### රුපියල් 500

මුහුණත - ශ්‍රී දළදා මාළිගාවෙහි ඇති ගලින් නෙලන ලද ඇත් රූපයක්

පසුපස - අනුරාධපුර අභයගිරි ස්ථූපය, මල් ගොමුවක වසා සිටින කුරුල්ලෙක්, සමනළයෙක්

### රුපියල් 1000

මුහුණත - කඳුකර දර්ශනයක් පසුබිම්කර ගත් වික්ටෝරියා වේල්ල

පසුපස - රුහුණු විශ්වවිද්‍යාලය, මොණරෙක්

## අපේ පෞරාණික උරුම නෝට්ටුවට

10 **වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** 1991 වර්ෂයේ නිකුත් කළේ ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමයන් යන තේමාව යටතේ.

එයට රුපියල් 10, 20, 50, 100, 500 සහ 1000 වටිනාකම්වලින් යුත් නෝට්ටු ඇතුළත් වූ අතර එම නෝට්ටු කාණ්ඩය යටතේ ම 2006 වසරේ රුපියල් 2000 වටිනාකම ඇති නෝට්ටුවක් ද නිකුත් කළා. මෙතෙක් ලංකාවේ වැඩි ම කාලයක් සංසරණය වූ නෝට්ටු කාණ්ඩය මෙය යි.




9 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

## එම නෝට්ටුවල ඇතුළත් රූ සටහන්

### රුපියල් 10

මුහුණත - කැටයම් සහිත ශිලාමය සිංහ රූපයක්, නෝට්ටුවේ මැද සඳකඩ පහණක්

පසුපස - පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල (වර්තමාන ජනාධිපති ලේකම් කාර්යාලය), මල් පොකුරක්, ලතුවැකියෙක්.

### රුපියල් 20

මුහුණත - සාම්ප්‍රදායික සිංහල වෙස් මුහුණක්, පැරණි ලියවැල් මෝස්තරයක්

පසුපස - රිටිපන්න ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන් දෙදෙනෙක්, කහ ඉරි නාම්බෙක් (මත්ස්‍ය විශේෂයක්), කොරල් පරයක්, ශංඛයක්.

### රුපියල් 50

මුහුණත - වෙස් තට්ටුව පැළඳි සාම්ප්‍රදායික සිංහල නැටුම් ශිල්පියෙක්, මුරගලක්, සඳකඩ පහණක්

පසුපස - කැටයම් සහිත කඩු මිටක්, කැටයම් සහිත බන්දේසියක්, අනුරාධපුර ථූපාරාම දාගැබ, ජේතවනාරාම දාගැබ.

### රුපියල් 100

මුහුණත - පැරණි විසිතුරු බඳුනක්, සඳකඩ පහණක්

පසුපස - ගිරව් දෙදෙනෙක්, තේ දලු නෙළන්නියන් දෙදෙනෙක්

### රුපියල් 500

මුහුණත - බෙරකරුවෝ දෙදෙනෙක්, උඩරට නැටුම් ශිල්පියෙක්, සඳකඩ පහණක්, ශ්‍රී මහ බෝධිය.

පසුපස - අනුරාධපුර රුවන්වැලි මහා සෑය, උඩවැඩියාමල්, පිළිහුඩුවෙක්

### රුපියල් 1000

මුහුණත - අලංකාරව සරසන ලද ඇතෙක් ඇත් ගෙව්වා ද සමගින්, දළදා කරඬුව දරා සිටින ඇතෙක්, සඳකඩ පහණක්, හංස පූට්ටු මෝස්තරයක්, සිංහ කැටයමක්.

පසුපස - ශ්‍රී දළදා මාලිගාවේ පත්තිරිප්පුව, මොණරු දෙදෙනෙක්, නෙළුම් මල්





















10 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය

**රුපියල් 2000**

| | | | | | |
|---|---|---|---|---|---|
| මුහුණත | - | සීගිරි පර්වතය, සේසත් | පසුපස | - | සීගිරි ළඳුන් |

**මේ දක්වා නිකුත් කර ඇති ඉතිරි නෝට්ටු කාණ්ඩ සහ සමරුකාසිවල සවිස්තරාත්මක තොරතුරු ලබන කලාපයේ පළවේ.**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.